# දෙවැනි කොටස


| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | පිටුව |
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු | ... | .. | I | – | XLII |
| කාර්ය මණ්ඩල පුවත් | .. | .. | XLIII | – | XLV |

## මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් හා බැංකු කටයුතු ... ... ... | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව ... ... ... | VI |
| බැංකු සංවර්ධන ... ... ... | VII |
| බැංකු පරිපාලන ... ... ... | VIII |
| සංවර්ධන මුදල් ... ... ... | IX |
| ග්‍රාමීය ණය ... ... ... | XIV |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ... ... | XVIII |
| ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය ... ... | XXII |
| සේවක අර්ථසාධක අරමුදල් ... ... ... | XXII |
| විනිමය පාලන ... ... ... | XXIV |
| රාජ්‍ය ණය ... ... ... | XXVI |
| ප්‍රාදේශීය කාර්යාලය—මාතර ... ... ... | XXVII |
| ප්‍රාදේශීය කාර්යාලය—අනුරාධපුරය ... ... | XXXIV |
| ප්‍රාදේශීය කාර්යාලය—මාතලේ ... ... | XXXVIII |
| අනුග්‍රාහක සේවා ... ... ... | XXXIX |
| ප්‍රකාශන ... ... ... | XXXIX |
| සම්මන්ත්‍රණ ... ... ... | XL |
| සමීක්ෂණ ... ... ... | XL |
| පුහුණු කිරීම් ... ... ... | XL |
| දත්ත සැකසුම් ... ... ... | XLI |
| කළමනාකාරිත්ව විගණන ... ... ... | XLII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1985 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1985 දෙසැම්බර් 31 වැනි දයින් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

1985 අවසානයේදී, මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය ඉකුත් වර්ෂයේ පැවති මට්ටමට වඩා සියයට 23.7 ක වැඩි වීමක් පෙන්නුම් කරමින්, රුපියල් දශ ලක්ෂ 41,158.6 ක් විය. වත්කම් වැඩි වූයේ, ප්‍රධාන වශයෙන්ම, රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් වැඩි වීමේත්, වෙනත් වත්කම් හා ගිණුම් සැළකිය යුතු ලෙස ඉහළ යාමේත්, ප්‍රතිඵලයක් වශයෙන් දේශීය වත්කම් (සියයට 41.7 කින්) ඉහළ ගිය බැවිනි. එසේ වුවද, ජාත්‍යන්තර සංචිතය රුපියල් දශ ලක්ෂ 11,429.6 දක්වා සියයට 9 කින් පහත වැටිණි. මෙම කාලය තුළදී, ප්‍රධාන වශයෙන්ම, අනෙකුත් වත්කම් හා ගිණුම් (සියයට 33.1) වැඩි වීමේත්, තැන්පතු (සියයට 16.9), සංසරණයෙහි පවත්නා නෝට්ටු හා කාසි (සියයට 17.9) හා මහ බැංකු සුරැකුම්පත් (සියයට 109.6) වැඩිවීමේත්, හේතුවෙන් බැංකුවේ වගකීම් ඉහළ ගියේය.

1985 වර්ෂය සඳහා බැංකුවේ ආදයම රුපියල් දශ ලක්ෂ 3,825.0 ක් විය. මෙය, ඉකුත් වර්ෂයේ ආදයමට වඩා සියයට 21.0 ක වැඩි වීමකි. වියදම් සඳහා ඉඩහැර, සංචිත ගිණුම් සඳහා වෙන් කිරීම් හා ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන වෙන් කළ පසු, මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 1,789.0 ක් විය. මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය අනුව බැංකුවේ අතිරික්තයට රුපියල් දශ ලක්ෂ දහයක් එක් කරන ලදී. රජය විසින් මහ බැංකුව වෙත නොපියවා ඇති ණයෙන් කොටසක් පියවීම සඳහා ශේෂ වූ රුපියල් දශ ලක්ෂ 1,779.0 ක මුදල, මුදල් නීති පනතේ 39(ඇ) වගන්තිය ප්‍රකාර රජයට ගෙවන ලදී.

### විදේශ විනිමය ගණුදෙනු

වාණිජ බැංකු සමග කෙරෙන ගණුදෙනුවලදී, ශ්‍රී ලංකා රුපියල්වලට සාපේක්ෂව, එක්සත් ජනපද ඩොලර් සඳහා, දෛනික එතැන් මිළදී ගැණුම් හා විකුණුම් අනුපාතිකයන් නිර්ණය කිරීම, මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. එසේ නිර්ණය කරනු ලබන ගැණුම් හා විකුණුම් අනුපාතිකයන්, මහ බැංකුව, එතැන් පදනමක් අනුව එ. ජ. ඩොලර් මිළට ගැනීම හා විකිණීම කරනු ලැබේ. 1985 දෙසැම්බර් අවසානයේදී එ. ජ. ඩොලරයක එතැන් ගැණුම් හා විකුණුම් අනුපාතික පිළිවෙලින් රුපියල් 27.4000 ක් හා රුපියල් 27.4150 ක් විය.

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව, එ. ජ. ඩොලර්වලින් සිය විකුණුම් හා මිළදී ගැණුම් කරගෙනයාම සඳහා, වාණිජ බැංකුවලට ඉදිරි ආවරණ සැළසීම, මහ බැංකුව විසින් තවදුරටත් කරගෙනයන ලදී. මාස තුනක් දක්වා වූ කාලසීමාවකට එකී ආවරණය සැළසිණි. 1985 අවසානයේදී, මහ බැංකුව එක් මසක් සඳහා වූ විනිමය ගිවිසුම් මත එ. ජ. ඩොලර් එතැන් මධ්‍ය විනිමය අනුපාතිකය අනුව මිළට ගෙන, එ.ජ. ඩොලර් 100ක් සඳහා රු. 4.00 ක අධි මිළක් යටතේ විකුණනු ලැබීය. තෙමසක් සඳහා වූ විනිමය ගිවිසුම් මත මිළදී ගැණීම සහ විකිණීම එතැන් මධ්‍ය අනුපාතිකයට සාපේක්ෂව එ. ජ. ඩොලර් 100 ක් සඳහා පිළිවෙලින් රු. 0.50 ක වට්ටමක් සහ රු. 20.00 ක අධි මිළක් යටතේ කරගෙන යන ලදී.

### ආසියානු නිෂ්කාෂණ සංගමය

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී, ආසියානු නිෂ්කාශන සංගමය මගින් කළ ගණුදෙනුවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 5,960.1 ක් විය. ඉකුත් වර්ෂය තුළදී, එමගින් රුපියල් දශ ලක්ෂ 7,370.5 ක ගණුදෙනු කෙරිණි.

# මුදල් හා බැංකු ගණුදෙනු

ශ්‍රී ලංකා මහ බැංකුවේ

**1985 දෙසැම්බර් මස 31 වැනි**

වගකීම්

| 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම්** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 6,90,00,000 | 8,40,00,000 | අතිරික්තය .. | 7,00,00,000 | 8,50,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 921,85,48,130 | | නෝට්ටු .. | 1,076,38,00,798 | |
| 38,14,89,551 | 960,00,37,681 | කාසි .. | 55,56,34,845 | 1,131,94,35,643 |
| | | **තැන්පතු** | | |
| 134,43,26,827 | | රජය .. | 211,99,25,142 | |
| 8,42,98,409 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 8,54,47,855 | |
| 402,55,40,681 | | වෙළෙඳ බැංකු .. | 549,01,56,739 | |
| 507,55,81,166 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 410,89,63,586 | |
| 57,181 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 11,51,19,625 හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 54,476 | |
| 59,02,14,937 | 1,112,00,19,201 | අනෙකුත් .. | 119,07,16,724 | 1,299,52,64,522 |
| | 1,27,23,480 | විදේශීය ණය ගැනීම් .. | | 59,92,891 |
| | 77,50,00,000 | මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල .. | | 77,50,00,000 |
| | 11,00,00,000 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | | 15,00,00,000 |
| | 55,73,15,000 | ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | | 116,81,25,000 |
| | 1,101,27,47,243 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 1,465,98,00,056 |
| | 3,327,18,42,605 | | | 4,115,86,18,112 |

**1985 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්**

| 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 166,02,50,639 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන්පසුව කරන ලද වෙන් කිරීම් | | 188,22,74,433 |
| | | 1985 දෙසැම්බර් 31 වැනිදයින් අවසන්වූ වර්ෂයේ ශුද්ධ ලාභය | | |
| | | මූල්‍ය ගැලපීම් ගිණුමට මුදල් නීති පණතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට | 15,37,35,000 | |
| 10,00,000 | | මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොදා ගන්නා ලදී. | 1,00,00,000 | |
| 150,04,61,262 | 150,14,61,262 | මුදල් නීති පණතේ 39 (ඇ) වගන්-තිය ප්‍රකාර රජයට – ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | 177,90,00,000 | 194,27,35,000 |
| | 316,17,11,901 | | | 382,50,09,433 |

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති

**එන්. ඒ. ධර්මබන්ධු**
ප්‍රධාන ගණකාධිකාරී

## ගිණුම—1985

## දිනට ශේෂ පත්‍රය

### වත්කම්

| 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 984,28,50,625 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 832,80,92,837 | |
| 271,56,46,847 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 309,99,13,490 | |
| 54,17,574 | 1,256,39,15,046 | විශේෂ ගැනුම් හිමිකම්පත් | 15,64,189 | 1,142,95,70,516 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 404,34,61,262 | | රජයට .. | 421,81,76,362 | |
| | | අනෙකුත් අයට–මධ්‍යම හා | | |
| 64,98,53,108 | | දීර්ඝකාලීන .. | 69,25,01,865 | |
| 166,23,01,280 | | කෙටිකාලීන .. | 144,44,75,344 | |
| 1,120,56,74,601 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 1,854,24,23,324 | |
| 11,00,00,000 | 1,767,12,90,251 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා .. | 15,00,00,000 | 2,504,75,76,895 |
| | 303,66,37,308 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 468,14,70,701 |
| | | *1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697 ක් සහ රු. 34,340 ක් විය.) | | |
| | 3,327,18,42,605 | | | 4,115,86,18,112 |

## අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1984 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් |
|---|---|---|
| 316,17,11,901 | පොළී, ඉපැයීම් ආදිය .. | 382,50,09,433 |
| 316,17,11,901 | | 382,50,09,433 |

1985 දෙසැම්බර් මස 31 වැනි දිනට අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පණතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (පරි. 422) 42(1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පනතේ (පරි. 422) 42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරේ.

කොළඹ 7.
විගණන කාර්යාලයේදීය.
1986 අප්‍රේල් 11 වැනි දින.

**ඩී. එච්. එෆ්. හේවාගමගේ**
වැඩබලන විගණකාධිපති.

1985 වර්ෂය තුළදී කළ ගෙවීම්වල ප්‍රතිඵලය වශයෙන් රුපියල් දශ ලක්ෂ 914.5 ක ශුද්ධ ගෙවීමක් සිදු විය. 1984 දී මෙමගින් වූයේ, රුපියල් දශ ලක්ෂ 150.1 ක ශුද්ධ ලැබීමකි.

1985 අගෝස්තු 1 වැනිදට පෙරාතුව ආ.නි.ස. සාමාජික රටවල ව්‍යවහාර මුදල් සඳහා විනිමය අනුපාතික දින 10 කට වරක්, එනම්, සෑම මාසයකම 1, 11 හා 21 යන දිනවලදී ප්‍රකාශයට පත්කරන ලදී. 1985 අගෝස්තු 1 වැනි දින සිට මෙම ක්‍රමය වෙනස් කොට ආ.නි.ස. මුදල් සඳහා විනිමය අනුපාතිකයන් දිනපතා ප්‍රකාශයට පත් කිරීම ඇරඹිණි.

සමස දක්වා වූ එතැන් හා ඉදිරි විනිමය මුදල් විකුණුම් හා මිළදී ගැණුම් තවදුරටත් කරගෙන යන ලදී. අදාළ මුදල් වර්ග වූයේ, බංගලාදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල්, ඉරාන රියාල්, නේපාල රුපියල් හා පකිස්ථානු රුපියල්ය.

**කෙටිකාලීන ණය**

රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණයවලට අදාළ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන, වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් වෙනුවෙන් මහ බැංකුවේ පොළී අනුපාතිකය (බැංකු අනුපාතිකය) 1985 දෙසැම්බර් 30 වැනි දින සිට වසරකට සියයට 13 සිට සියයට 11 දක්වා අඩු කරන ලදී.

අපනයන සඳහා, ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය යටතේ මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට ණය දීම වසර මුළුල්ලේම නොකඩවා කෙරිණි. එහෙත්, 1985 පෙබරවාරි 1 වැනි දින සිට II වැනි කාණ්ඩය යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමයෙහි සංශෝධන කිහිපයක් කරන ලදී. මේ අනුව, I වැනි කාණ්ඩය යටතේ දුන් ආකාරයටම II වැනි කාණ්ඩය යටතේද ප්‍රතිමූල්‍ය ණය දෙනු ලැබූ අතර, ප්‍රතිමූල්‍ය සඳහා සිය ගණුදෙනුකරුවන් විසින් II වැනි කාණ්ඩය යටතේ වාණිජ බැංකුවලට භාරදෙන ලද පොරොන්දු නෝට්ටු වට්ටම් කිරීමේ සහනය ඉවත් කරන ලදී. II වැනි කාණ්ඩය යටතේ අපනයන වෙනුවෙන් වූ ප්‍රතිමූල්‍ය ණය සඳහා අය කෙරෙන පොළී අනුපාතිකය වසරකට සියයට 10 සිට 8 දක්වා සියයට 2 කින් අඩු කරන ලදී. තවද, මෙම කාණ්ඩය යටතේ ගැනෙන අපනයන සඳහා ප්‍රතිමූල්‍යන කාලසීමාව දින 90 දක්වා දීර්ඝ කරන ලදී.

I වැනි කාණ්ඩය හා II වැනි කාණ්ඩය යටතේ අපනයන වෙනුවෙන් ප්‍රතිමූල්‍ය ණය සඳහා මහ බැංකුව අය කරනු ලබන පොළී අනුපාතික 1985 දෙසැම්බර් 30 වැනි දින සිට පිළිවෙලින් වසරකට සියයට 11 දක්වා හා සියයට 6 දක්වා සියයට 2 බැගින් අඩු කරන ලදී. නියමිත කාලසීමාවන් තුළදී අපනයනවල අලෙවි ප්‍රතිලාභයන් ශ්‍රී ලංකාවට ලැබුණු විට, ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් අයකරන ලද පොළියෙන් සියයට 4 ක් අදාළ ගණුදෙනුකරුවනට ආපසු දීමද, මහ බැංකුව විසින් තවදුරටත් කර ගෙන යනු ලැබීය.

සමුපකාර සමිතිවල හෝ වී, එළවළු හා වෙනත් නියමිත භෝග වර්ග නිෂ්පාදනයට සම්බන්ධිත පුද්ගලයන්ගේ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන, මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙනු ලබන ණය සඳහා අය කෙරෙන පොළී අනුපාතිකය, වර්ෂයකට සියයට 1.5 මට්ටමෙහිම තවදුරටත් පැවතිණි. වී මිළට ගැනීම හා මෙරට වවනු ලබන වෙනත් නියමිත භෝග වර්ග මිළට ගැනීම හා ගබඩා කිරීම සඳහා, මුදල් යෙදවීම පිණිස, සමුපකාර සමිතිවලට, ගොවිජනසේවා මධ්‍යස්ථානවලට හා බලයලත් පුද්ගලයනට දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන් වූ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන, මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් සඳහා, අය කෙරෙන පොළී අනුපාතිකය වසරකට සියයට 3 සේ නොවෙනස්ව පැවතිණි.

**මැදි හා දිගුකාලීන ණය**

මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය මහ බැංකුව විසින් 1985 වර්ෂය තුළදී ද නොකඩවා පවත්වාගෙන යන ලදී. මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය ක්‍රමයේ II, III හා IV වැනි කාණ්ඩ යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා අදාළ වන පොළී අනුපාතිකද, සියයට 2 කින් අඩු කරන ලදී. වසර තුළදී, රටේ සංචාරක කර්මාන්තය දුෂ්කරතාවලට මුහුණ දුන් හෙයින්, හිඟ පොළී හා ණය කොටස් ගෙවීම ප්‍රතිමූල්‍යනය සඳහා මහ බැංකුව විසින් මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ, ප්‍රතිමූල්‍ය ණය ක්‍රමයක් ආරම්භ කරන ලදී. මැදි හා දිගුකාලීන ණය අරමුදලේ මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 775 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 692.5 ක ප්‍රමාණයක් ණය ලබාගත් ආයතන මගින් නොපියවා පැවති ඒවා විය.

**වාණිජ බැංකු ණය**

1984 දී පනවන ලද ණය සීමාවන් 1985 වර්ෂය තුළදීද ක්‍රියාත්මක කෙරිණි. එම සීමාවනට අනුව පහත දැක්වෙන කරුණු පිළිපැදිය යුතු බවට මහ බැංකුව විසින් සියළුම වාණිජ බැංකුවලට දන්වා ඇත.

(අ) අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සඳහා දෙනු ලබන මුළු අත්තිකාරම් ප්‍රමාණය, 1984 මාර්තු 23 වැනි දිනට දෙනු ලැබ, නොපියවා ඇති අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

(ආ) අත්‍යවශ්‍ය නොවන ආනයන වෙනුවෙන්, 1984 මාර්තු 23 වැනි දිනට නොපියවා තිබුණු මට්ටම ඉක්මවා නව ආනයනකරුවනට ණය නොදිය යුතුය.

(ඇ) අපනයන හා කෘෂි කර්මාන්තය හැර වෙනත් කටයුතු සඳහා පෞද්ගලික අංශයට දෙනු ලැබ, නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය 1984 මැයි 11 වැනි දිනට දෙනු ලැබ නොපියවා ඇති එකී අත්තිකාරම්වල මුළු ප්‍රමාණය ඉක්මවා සියයට 5 කට වැඩි නොවිය යුතුය.

**සංචිත අවශ්‍යතාවයන්**

1985 අගෝස්තු 9 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, වාණිජ බැංකුවලට අදාළ සංචිත අවශ්‍යතාවයන් පහත දැක්වෙන අන්දමට වෙනස් කරන ලදී.

(1) ඉල්ලුම් තැන්පතු සඳහා සංචිත අනුපාතය සියයට 18 දක්වා සියයට 2 කින් වැඩි කරන ලදී.

(2) දින 90 කට වඩා අඩු කාලසීමාවන් සඳහා භාර ගනු ලබන කාලීන තැන්පතු සඳහා සංචිත අනුපාතය සියයට 12 දක්වා සියයට 4 කින් වැඩි කරන ලදී.

(3) ඉහත (2) යටතේ දක්වුණු ඒවා හැර කාලීන තැන්පතු හා ඉතිරිකිරීම් තැන්පතු සඳහා සංචිත අනුපාතයන් සියයට 10 දක්වා සියයට 2 කින් වැඩිකරන ලදී.

(4) සිය මුළු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වගකීම් වෙනුවෙන්, අවශ්‍ය සංචිත වලින් ⅓ ක උපරිමයක් දක්වා සීමාසහිත ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය මගින් නිකුත් කෙරුණු පිළිණපත් තබා ගැනීමට වාණිජ බැංකුවලට ඉඩ දෙන ලදී.

1985 සැප්තැම්බර් 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, දින 90 කට වඩා අඩු කාලසීමාවන් සඳහා භාරගනු ලබන කාලීන තැන්පතු සඳහා සංචිත අනුපාතය සියයයට 14 දක්වා සියයට 2 කින් වැඩි කරන ලදී.

### ද්විතීය වෙළෙඳපොලේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනු

ද්විතීය වෙළෙඳපොලේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනුවල මහ බැංකුව තවදුරටත් නිරත විය. 1984 දී රුපියල් දශ ලක්ෂ 39,835.6 ක් වූ විකුණුම්, 1985 දී රුපියල් දශ ලක්ෂ 75,844.1 ක් දක්වා තියුණු ලෙස වැඩි විය. මේ අතර, 1984 දී රුපියල් දශ ලක්ෂ 25,677.4 ක් වූ මිළට ගැණුම් 1985 දී රුපියල් දශ ලක්ෂ 37,131.5 දක්වා වැඩි විය. මෙම ක්‍රමය යටතේ ගණුදෙනු කැපී පෙනෙන ලෙස වැඩි වීමට ප්‍රධාන හේතුව වූයේ, ඒක්ෂණ ණය අනුපාතිකයන් හා ද්විතීය වෙළෙඳපොලේ භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයන් අතර ආදයම් වෙනස ඉකුත් වර්ෂයේදී මෙන්ම සුළුව පැවතීමය.

1985 දී ඒක්ෂණ ණය සඳහා පොළී අනුපාතිකයන් වසරකට සියයට 10.5 හා සියයට 16.75 අතර වරින්වර වෙනස් වූ අතර, ද්විතීය වෙළෙඳපොලේ භාණ්ඩාගාර බිල්පත්වලට අදළ වූ වට්ටම් අනුපාතිකයන් වසරකට සියයට 11.3 හා සියයට 14.2 අතර වරින්වර වෙනස් විය.

### පෙරළා සියරට යන ඉන්දියානුවන් වෙත ආධාරක හා කරුණා සහගත ගෙවීම්

1964 ඉන්දු ලංකා ගිවිසුම යටතේ ගැනෙන ඉන්දියානු සම්භවය ඇති වතු කම්කරුවන් පෙරළා සිය රට යැවීම ඉක්මන් කරවනු පිණිස, ක්‍රම දෙකක් රජය වෙනුවෙන් ක්‍රියාත්මක කරවීම, බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මේවා නම් :

(අ) එසේ පෙරළා සිය රට යන්නන් හට ප්‍රේෂණය කිරීමට බලය දෙන ලද ප්‍රමාණයෙන් සියයට 65 කට සමාන මුදලක් හෝ ඉන් කොටසක් ආධාර වශයෙන් ගෙවීම ; සහ

(ආ) මෙකී කම්කරුවනට ශ්‍රී ලංකාව හැර යැමට දිරි ගැන්වීමක් වශයෙන් කරුණා සහගත ගෙවීමක් ලෙස රුපියල් 500 ක් හා එම මුදලින් සියයට 65 ක් ගෙවීම.

මහ බැංකුවේ අනුමැතිය යටතේ මෙකී ක්‍රම දෙකම ක්‍රියාත්මක කරන ලද්දේ වාණිජ බැංකු මගිනි. 1985 වසර තුළ, ආධාරක ක්‍රමය යටතේ සිය රට යන්නන් හට රුපියල් දශ ලක්ෂ 0.3 ක් ගෙවන ලදී. වසර තුළදී සිය රට යන්නන් 1,710 දෙනෙක් වෙනුවෙන් ගෙවන ලද කරුණා සහගත ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1.4 ක් විය.

### අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරණ ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහ බැංකුව, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල පරිපාලනය කළේය. වර්ෂය තුළදී, බැංකුව විසින් ප්‍රතිලාභ ඉල්ලුම්පත් 392 ක් මත රුපියල් දශ ලක්ෂ 2.6 ක් (පොළියද ඇතුළුව) දයකයිනට ගෙවන ලදී.

### රාජ්‍ය ගිණුම්

බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ගිණුම් ශාඛාව, රජයේ බැංකුකරු වශයෙන් රාජ්‍ය දෙපාර්තමේන්තුවල, රාජ්‍ය නියෝජ්‍යතව හා ආයතනවල සහ සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. 1985 දෙසැම්බර් අවසානයේදී රාජ්‍ය ගිණුම් අංශයෙහි වූ සක්‍රිය ගිණුම් සංඛ්‍යාව 160 ක් (රජයේ දෙපාර්තමේන්තු 145 හා වෙනත් 15) විය.

## ව්‍යවහාර මුදල් නිකුතුව

1985 දෙසැම්බර් 31 වැනි දිනට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11,319.4 ක් විය. එය ඉකුත් වර්ෂය අවසානයේ අනුරූපී සංඛ්‍යාවට වඩා රුපියල් දශ ලක්ෂ 1,719.4 ක වැඩි වීමකි. වර්ෂය තුළදී ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,545.3 කින් හා රුපියල් දශ ලක්ෂ 174.1 කින් වැඩි විය.

1985 වර්ෂය තුළදී රු. 50, රු. 100, රු. 500 හා රු. 1,000 යන වැඩි වටිනාකමින් යුත් නෝට්ටු සඳහා පැවති ඉල්ලුමේ වෙනස්කම් ඇති විය. 1984 වසරේදී රුපියල් දශ ලක්ෂ 241 ක පහත වැටීමක් වාර්තා වුනු රු. 1,000 නෝට්ටුවෙහි සංසරණය, සැළකිය යුතු අන්දමින් ඉහළ යමින් සියයට 40 ක වර්ධනයක් වාර්තා කළ අතර, රු. 500 හා රු. 50 වටිනාකම් වලින් යුතු නෝට්ටු සඳහා පැවති ඉල්ලුම බොහෝ දුරට නොවෙනස් තත්ත්වයක පැවතුණි. අනෙක් අතට, රු. 100 නෝට්ටු සංසරණය 1985 වසරේදී සැළකිය යුතු අන්දමින් වැඩි විය.

සියළු වටිනාකම්වලින් යුත් කාසි සඳහා පැවති ඉල්ලුම (ශත 1 හා ශත 2 හැරුණුවිට) 1985 දී තවදුරටත් වැඩි වූ අතර, වැඩි වන ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් තොග පවත්වාගෙන යාමට බැංකුව පියවර ගෙන ඇත.

රු. 5 හා රු. 2 යන වටිනාකම් වලින් යුත් නෝට්ටු වෙනුවට, භාවිතය සඳහා එම වටිනා-කම්වලින් යුත් නව කාසි 1985 ජනවාරි මාසයේදී සංසරණය සඳහා නිකුත් කරන ලදී. කෙසේ වුවද, රු. 5 හා රු. 2 නෝට්ටුද මෙම කාසි සමග සංසරණයෙහි යෙදෙන අතර, එම නෝට්ටු භාවිතා කළ හැකි කාලය ගෙවීයත්ම, ක්‍රමයෙන් ඒවා සංසරණයෙන් ඉවත් කර ගනු ලැබේ.

## බැංකු සංවර්ධනය

1985 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාව තුළ වාණිජ බැංකු 25 ක් ක්‍රියාත්මකව පැවතුණි. මීට දේශීය බැංකු 4 ක් හා විදේශීය බැංකු 21 ක් අයත් වූ අතර, ප්‍රධාන ශාඛා පද්ධතිය 600 ක් විය. මීට අමතරව, ග්‍රාමීය බැංකු 907 ක් සහ කෘෂි සේවා මධ්‍යස්ථාන 53 ක්ද විය. තවද, විදේශීය බැංකු නියෝජිත කාර්යාල දෙකක් සහ වණික් බැංකු සමාගම් දෙකක් රට තුළ ව්‍යාපාර කටයුතුවල නිරත විය.

1985 වර්ෂය තුළ නව වාණිජ බැංකු ශාඛා 14 ක් විවෘත කෙරිණ. මේවා සම්පූර්ණයෙන්ම වාගේ රාජ්‍ය අංශයේ බැංකු දෙකට අයත් විය. මහජන බැංකුව විසින් ශාඛා 4 ක් (1985 ජනවාරි මාසයේදී නැවත විවෘත කැරුණු කැබිතිගොල්ලෑව ශාඛාව ඇතුළුව) විවෘත කරන ලද අතර, කොම්පඤ්ඤවීදියේ පිහිටි සිය විදේශීය ශාඛාව වසා දමන ලදී. මේ අනුව, මහජන බැංකුවේ මුළු ශාඛා ගණන 293 ක් විය. ලංකා බැංකුව ශාඛා 9 ක් (ප්‍රධාන ශාඛාවක් වශයෙන් උසස් කරන ලද හක්මන කෘෂි සේවා මධ්‍යස්ථානයද ඇතුළුව) විවෘත කරන ලද අතර, ආරක්ෂක හේතූන් නිසා උයිලන්කුලම සහ කන්තලේ සීනි කර්මාන්තශාලා ශාඛා ඒ අසල පිහිටි ශාඛා සමඟ ඒකාබද්ධ කරන ලදී. මෙ අනුව, 1985 වර්ෂය අවසාන වනවිට ලංකා බැංකුවේ ශාඛා ගණන 236 ක්ව පැවතුණි. මීට අමතරව, ලංකා වාණිජ බැංකුව විසින් 1985 ජනවාරි මාසයේදී කොළඹ නව ශාඛාවක් විවෘත කරන ලද අතර, ඔවුන්ගේ මුළු ශාඛා ගණන 14 ක් විය. මෙම විකාශනයන් සමග 1985 වර්ෂය අවසානයේදී සියළුම වාණිජ බැංකුවල මුළු ශාඛා ගණන 600 ක්ව පැවතුණි. වර්ෂය තුළදී, ජාතික ඉතිරි කිරීමේ බැංකුවද ශාඛා 4 ක් මහරගම, දෙනියාය, අකුරැස්ස සහ නුවරඑළිය යන ස්ථානවල විවෘත කරනු ලැබූ පසු, 1985 වර්ෂය අවසාන වනවිට, එහි මුළු ශාඛා සංඛ්‍යාව 56 ක් විය. පසුගිය වර්ෂවල මෙන් ශාඛා කාර්යාල වඩා ඉඩකඩ සහිත හා පහසු ස්ථාන කරා ගෙන යන ලදී. 1985 දී දේශීය ශාඛා කාර්යාල 19 ක් සහ විදේශීය ශාඛා කාර්යාල 3 ක් මේ අයුරින් ගෙනගොස් ඇත.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම, ශ්‍රී ලංකාවේ බැංකු සංවර්ධනයෙහිලා, 1985 වර්ෂයේදී දක්නට ලැබෙන වැදගත් සන්ධිස්ථානයක් විය. ප්‍රා. ග්‍රා. සං. බැංකුවල මූලික අරමුණ, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය බැංකු කටයුතු සහ ග්‍රාමීය සංවර්ධනය නංවාලීමයි. සිය මෙහෙයවුම් කටයුතු සඳහා මෙම බැංකුවලට නියමිත ප්‍රදේශයක් ඇත. මෙය දැනට දිස්ත්‍රික්කවලට සීමාවී ඇත. කළුතර, කුරුණෑගල, මාතර හා අනුරාධපුර යන දිස්ත්‍රික්කවල මෙහෙයවීම් කටයුතු ආවරණය වන පරිදි, පිළිවෙලින් බුලත්සිංහල, කුලියාපිටිය, යටියන - මැද උයන්ගොඩ හා මීහින්තලේ

ප්‍රා. ග්‍රා. සං. බැංකු 4 ක් වර්ෂය තුළදී ආරම්භ කෙරිණ. මීට අමතරව, 1985 වර්ෂය පසු භාගයේදී ප්‍රා. ග්‍රා. සං. බැංකු කාර්යාල 17 ක් විවෘත කරන ලදී. මේවා කළුතර හා මාතර දිස්ත්‍රික්කවල ශාඛා 4 බැගින් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශාඛා 6 ක්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශාඛා 3 ක්ද, වශයෙන් විය.

මහ බැංකුවේ සමහර අංශවලට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය වඩාත් කාර්යක්ෂම අන්දමින් ඉටුකිරීම සඳහා අතිරේක ස්ථාන පහසුකම් ලබාදීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේ ප්‍රතිපත්තිය සපුරාලීම පිණිස, මහනුවර, මාතලේ හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල අවශ්‍යතා ඉටුකරලීම සඳහා, මහ බැංකුව සිය තුන්වැනි ප්‍රාදේශීය කාර්යාලය, 1985 දෙසැම්බර් මාසයේදී, මාතලේ නගරයේ විවෘත කළේය. පළමුවැනි හා දෙවැනි ප්‍රාදේශීය කාර්යාල 1981 හා 1982 වර්ෂවලදී පිළිවෙලින් මාතර හා අනුරාධපුරය යන නගරවල විවෘත කරන ලදී.

බැංකු කටයුතු අංශය නවීකරණය කිරීමට දිරි දීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමක් වශයෙනුත්, අනුග්‍රාහක සේවා දියුණු කිරීම සඳහාත්, සිය ප්‍රධාන කාර්යාලයේ සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ දවස පුරාම ක්‍රියාත්මක කිරීමේ පදනම මත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවි කිරීම සඳහා හොංකොං සහ ෂැන්හයි බැංකුවට මහ බැංකුව විසින් අවසර දෙන ලදී.

බැංකු සේවා පරිගණක ගත කිරීමේ එක් පියවරක් වශයෙන්, චෙක්පත් නිෂ්කාශණ කටයුතු වේගවත් කිරීම පිණිස, වාණිජ බැංකුවල අනුග්‍රහයද ඇතිව යන්ත්‍රීකෘත චෙක්පත් නිෂ්කාශණ ක්‍රමයක් පිහිටුවීම සඳහා මහ බැංකුව මූලික පියවර ගෙන ඇත. දැනට පවත්නා චෙක්පත් නිෂ්කාශණ ක්‍රියා පිළිවෙල සඳහා ගතවන කාලය මෙම නව ක්‍රමය නිසා අඩුවන අතර නිෂ්කාශණය කළහැකි චෙක්පත් සංඛ්‍යාවද වැඩිවනු ඇත.

## බැංකු අධීක්ෂණය

මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ, 1985 වර්ෂය තුළ වාණිජ බැංකු විස්සක පරීක්ෂණ කටයුතු මහ බැංකුව විසින් අවසන් කරන ලද අතර, 1984–85 පරීක්ෂණ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ කටයුතු කළ සෑම වාණිජ බැංකුවකම පරීක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලදී. තවදුරටත්, සෑම මාසයක් අවසානයෙහිදීම බැංකු මගින් එවන ලද වත්කම් හා වගකීම් ප්‍රකාශනයන් පදනම් කර ගනිමින් සියළුම වාණිජ බැංකුවල මූල්‍ය තත්ත්වය පිරික්සුමට භාජනය කරන ලදී. එසේම, එම බැංකු මගින් සැපයූ වාර්තා පදනම් කර ගෙන 1984 වර්ෂයේ බැංකුවල ලාභදායිත්වය පිළිබඳ අගැයීමක්ද කරන ලදී. ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන විදේශීය බැංකුවල සේවයේ යෙදී සිටින විදේශීය නිලධාරීන්ගේ සංඛ්‍යාව අඩු කරලීමේ අපේක්ෂාවෙන් එම බැංකු මගින් ඒවායේ දේශීය නිලධාරීන්ට ලබා දෙන පුහුණු වීමේ පහසුකම්ද බැංකුව මගින් පරීක්ෂාවට භාජනය කරන ලදී.

1979 අංක 27 දරණ මුදල් සමාගම් පාලන පනතේ විධිවිධාන යටතේ, මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි වූ මුදල් සමාගම් අධීක්ෂණයෙහි හා පරීක්ෂණයෙහිද මහ බැංකුව නිරත විය. මුදල් සමාගම් පාලන පනතේ 15 (1) වගන්තිය යටතේ, මුදල් සමාගම් තුනක පරීක්ෂණ කටයුතු 1985 වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. එකී පනත යටතේ ලියාපදිංචි වීම සඳහා මුදල් සමාගම් වලින් ලැබුනු ඉල්ලුම්පත් අගයන ලද අතර, වර්ෂය තුළදී සමාගම් හයක් මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි කෙරිණ. මුදල් සමාගම් විසින් මාසිකව ඉදිරිපත් කරන ලද මුළු තැන්පතු වගකීම්, මුළු ද්‍රවශීල වත්කම් දැක්වෙන ප්‍රකාශනයන්, වාර්ෂික ලාභාලාභ ගිණුම් හා ශේෂ පත්‍රද විශ්ලේෂණය කරන ලදී. එම කටයුත්ත ද්‍රවශීලතාවය, ප්‍රාග්ධන අරමුදල් අනුපාත සහ සංචිත අරමුදලට මාරු කිරීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය මගින් කරන ලද නියෝගයන්ට අනුකූලතාවය දැක්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් ඉටු කරන ලදී.

විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ, වාණිජ බැංකු මගින් ස්ථාපනය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ගණුදෙනු පරීක්ෂණය කිරීමේ කටයුතු ද සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී තවදුරටත් කර ගෙන යන ලදී.

## සංවර්ධන මුදල්

මහ බැංකු මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ. දි. ණ. අ.) යටතේ මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ ඉල්ලුම 1985 වර්ෂයේදී ද තවදුරටත් මධ්‍යස්ථ මට්ටමක පැවතුන අතර, එකී ණය අරමුදලේ II, III සහ IV කාණ්ඩ යටතේ අනුමත කෙරුන මුළු ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 143.6 ක් විය. මැදි හා දිගුකාලීන ණය අරමුදලේ I වැනි කාණ්ඩය පරිපාලනය කරනු ලබන්නේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මගිනි. මෙයින් වැඩි ප්‍රමාණයක්, එනම්, රුපියල් දශ ලක්ෂ 102 ක් අනුමත කරන ලද්දේ, වාණිජ බැංකු විසින් සංචාරක හෝටල් සඳහා දෙන ලද ණය සඳහා වූ හිඟ පොළිය ප්‍රාග්ධනගත කිරීම ඇතුළු අඩපණ වූ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම සඳහාය. ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් පිළිබඳ කැඩී සටහනක් 2.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. අරමුදල් සඳහා අනෙකුත් අංශයන්ගෙන් පැවැති ඉල්ලුම පහත් මට්ටමක පැවතුන අතර, බැංකු අංශයේ පැවතුන සතුටුදායක ද්‍රවශීලතා තත්ත්වය බොහෝ දුරට මේ සඳහා හේතු වූවා විය හැක.

**2 . 2 සංඛ්‍යා සටහන**
**මැදි හා දිගුකාලීන ණය අරමුදල**
**(කාණ්ඩ II—IV ප්‍රතිමූල්‍ය අනුමත කිරීම)**

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1983 | | 1984 | | 1985 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II. අපනයන අංශය .. | 43·7 | 36·5 | 113·0 | 79·1 | 13·7 | 9·0 |
| III. හා IV | | | | | | |
| (අ) කෘෂිකර්මය .. | 27·8 | 19·2 | 0·1 | 0·1 | 2·6 | 1·6 |
| (ආ) කර්මාන්ත .. | 9·7 | 7·0 | 98·2 | 49·1 | 38·9 | 27·2 |
| (ඇ) හෝටල් .. | 13·2 | 8·6 | — | — | — | — |
| (ඈ) අනෙකුත් .. | 5·8 | 3·5 | 2·2 | 1·3 | 6·5 | 3·9 |
| අඩපණ වූ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම .. | — | — | — | — | 145·5 | 101·9 |
| එකතුව | 100·2 | 74·8 | 213·5 | 129·6 | 207·2 | 143·6 |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව.

සංචාරක කර්මාන්තය මුහුණ පා ඇති උග්‍ර ද්‍රවශීලතා අර්බුදය සැළකිල්ලට ගෙන රජයේ මෙහෙය වීමෙන් මහ බැංකුව විසින් 1984 වසර මැද භාගයේදී සහන වැඩපිළිවෙලක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙකී වැඩපිළිවෙල යටතේ ණය මුදල්වල මුල් මුදල සහ පොළිය ආපසු ගෙවීම 1987 මාර්තු දක්වා තාවකාලිකව අත්හිටුවීමට හෝටල්වලට හිමිකමක් ලැබුණ අතර, අනතුරුව නොපියවා ශේෂ වී ඇති ණය මුදල දීර්ඝ කරන ලද කාලච්ඡේදයක් සඳහා නැවත ලේඛනගත කිරීමටත්, හිඟ පොළියෙන් සියයට 60 ක් මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරනු ලැබීමටත් ඉඩ සැලසිණ. සංචාරක ව්‍යාපාරයේ පහත වැටීම තවදුරටත් එලෙසින්ම පැවතීම සැළකිල්ලට ගෙන, ණය මුදල්වල මුල් මුදල හා පොළිය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීමට දෙන ලද සහනය, 1989 මාර්තු දක්වා දීර්ඝ කරනු ලැබූ අතර, ණය මුදලින් සියයට 80 ක් පමණක් නැවත ලේඛනගත කිරීමට මීට ප්‍රථමයෙන් දී තිබුන සහනය, සියයට 100 දක්වා වැඩි කරන ලදී. හෝටල්වල කාමර උපයෝගිතා අනුපාතයෙන් පෙන්නුම් කරනු ලබන පරිදි, වැඩිම බලපෑමක් ඇතිවූ හෝටල්වල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම පිණිස

රජය විසින් පොළී රහිත ණය මුදලක්ද ලබා දෙන ලදී. හෝටල් යෝජනා ක්‍රම 57 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 332.8 ක මුළු ණය මුදල් ප්‍රමාණයක් නැවත ලේඛනගත කිරීම මගින්, මූල්‍යමය වශයෙන් සහන සැළසීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී. එපරිද්දෙන්ම, තවත් හෝටල් 40 ක් සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 150.2 ක නොපියවා ඇති ණය ශේෂයක් ද නැවත ලේඛනගත කිරීම සඳහා සැළකිල්ලට භාජනය වෙමින් පවතී. හෝටල් 41 ක් මගින් ගිහ හිටුවා ඇති රුපියල් දශ ලක්ෂ 75.6 ක් වූ පොළිය බැංකු විසින් ප්‍රාග්ධනගත කරන ලදුව, ප්‍රතිමූල්‍ය පහසුකම් අයදුම් කරනු ලැබ මහ බැංකුව විසින් අනුමත කරනු ලැබීය. සංචාරක කර්මාන්තයට සහන සැළසීමේ වැඩපිළිවෙල යටතේ ලබා ඇති ප්‍රගතිය 2.3 සංඛ්‍යා සටහනින් දක්වා ඇත. මැදි හා දිගුකාලීන ණය අරමුදල සම්බන්ධයෙන් ඇති වූ තවත් සැළකිය යුතු වර්ධනයක් නම් වතු අංශය වෙනුවෙන් වූ මැදි කාලීන ආයෝජන වැඩපිළිවෙල යටතේ වන ආයෝජනයන්හි දේශීය මූල්‍ය සංයුතිය වශයෙන් රුපියල් දශ ලක්ෂ 260 ක් දක්වා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමට මහ බැංකුව විසින් ගෙන ඇති තීරණයයි.

**2 . 3 සංඛ්‍යා සටහන**
**සංචාරක කර්මාන්තයට සහන සැලසීම – 1985**
**ණය නැවත ලේඛන ගත කිරීම්**

| ණය ආයතනයේ නම | සම්පූර්ණ කරන ලද නැවත ලේඛන ගත කිරීම් | | සැලකිල්ලට භාජනය වෙමින් පවතින නැවත ලේඛන ගත කිරීම් | | මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරන ලද හිහ පොළිය (රුපියල්) |
|---|---|---|---|---|---|
| | හෝටල් සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | හෝටල් සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | |
| ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සමායතනය | 25 | 13,26,86,710 | — | — | 3,68,61,290 |
| ජාතික සංවර්ධන බැංකුව .. | 10 | 10,56,78,568 | — | — | 3,32,96,389 |
| මහජන බැංකුව .. | — | — | 22 | 8,76,34,783 | හිමිකම් පා නැත |
| ලංකා බැංකුව .. | 09 | 5,13,50,835 | 10 | 3,81,86,975 | හිමිකම් පා නැත |
| හැටන් නැෂනල් බැංකුව .. | 05 | 2,44,89,469 | — | — | 36,93,665 |
| කොමර්ෂල් බැංකුව .. | 04 | 49,41,450 | 08 | 2,43,83,776 | හිමිකම් පා නැත |
| ග්‍රින්ලේස් බැංකුව .. | 01 | 69,64,285 | — | — | හිමිකම් පා නැත |
| හබිබ් බැංකුව .. | 01 | 16,33,968 | — | — | හිමිකම් පා නැත |
| ඉන්දියානු රාජ්‍ය බැංකුව .. | 01 | 20,77,702 | — | — | හිමිකම් පා නැත |
| යුරෝපා ඒසියා බැංකුව .. | 01 | 30,59,256 | — | — | 18,33,943 |
| එකතුව .. | 57 | 33,28,82,243 | 40 | 15,02,05,534 | 7,56,85,287 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය (සුමක—II) යටතේ වාණිජ බැංකු විසින් දී ඇති ණය ප්‍රතිමූල්‍යකරණය සඳහා වෙන් කර ඇති අරමුදල් උපයෝජනය 1985 වර්ෂය තුළ වර්ධනය විය. මාසික අනුමතකිරීම්, මීට ඉහත කාලච්ඡේදයන්හි පැවති රුපියල් දශ ලක්ෂ 10 සමග සසඳන විට වසරේ දෙවන භාගයේදී රුපියල් දශ ලක්ෂ 30 දක්වා ඉහළ ගොස් තිබීමෙන් ඒ බව පෙනී යයි. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ණය ලබා ගැනීමේ දී තිබිය යුතු සුදුසුකම් වඩා පහසුකිරීම හා බැංකුවලට ලබාදුන් අමතර දිරිගැන්වීමය. තවද, 1985 ජූනි මස සිට, සුමක II යටතේ දෙනු ලබන උපරිම ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2 සිට රුපියල් දශ ලක්ෂ 4 දක්වා ඉහළ නංවන ලදී. මෙම වැඩි කිරීමට පිටිවහලක් වශයෙන් මහ බැංකුව මගින් ලබා දෙන සහතික ආවරණය රුපියල් 8,00,000 සිට රුපියල් 12,00,000 දක්වා වැඩි කරන ලදී.

මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සහතික ක්‍රම තුනට අදාළ පසු විපරම් කටයුතු 1985 දී තීව්‍ර කරන ලදී. යෝජනා ක්‍රම 81 ක් සෘජු පරීක්ෂණවලට භාජනය කරන ලදී. මහ බැංකුවේ පසු විපරම් කටයුතු වඩාත් පුළුල් වීම නිසා ආපසු අයකර ගැනීම් වැඩි වූ අතර, අඩපණ වූ ඒකකයන් පුනරුත්ථාපනයද සිදු විය. 1985 දී සුමක ක්‍රම දෙකක් යටතේ වාරික තුනකට වැඩියෙන් හිඟ හිටුවා තිබූ ණය සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු විය. 1984 දී 850 ක් වූ මෙබඳු ණය මුදල් සංඛ්‍යාව 1985 දී 701 දක්වා පහත වැටිණ.

**ණය සහතික ගණුදෙනු**

ණය සහතික ගණුදෙනු පිළිබඳ සාරාංශයක් 2.4 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**සුළු පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය**

1978 දී ඇරඹුන සුළු පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය යටතේ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිර්දේශ මත ණය දෙන ආයතන දී ඇති ණය සඳහා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් ණය සහතික සපයන ලදී. 1981 අවසානයේදී සුමක ක්‍රමය ඇරඹීමත් සමඟ, එසේ සහතික නිකුත් කිරීම නවත්වන ලදී. එම ක්‍රමය යටතේ සපයා තිබුණු මුළු ණය සහතික සංඛ්‍යාව 767 ක් විය. 1985 අවසානය වනවිට මෙම ණය මුදල්වලින් 508 ක් සම්පූර්ණයෙන් අයකරගෙන තිබුණු බව වාර්තා වී ඇති අතර, සහතික 62 ක් කල් ඉකුත් වූ හෝ ඉවත් කර ගන්නා ලද ඒවා වශයෙන් සළකන ලදී. 1985 අවසන් වන විට ණය මුදල් 148 ක් සක්‍රියව පැවති අතර, ඒවායේ නොබේරු ණය ශේෂය රුපියල් දශ ලක්ෂ 3.6 ක් විය. මෙකී ණය මුදල් අතුරෙන් 118 ක ණය අයවිය යුතුව තිබිණ. 1985 දෙසැම්බර් අවසානය වනවිට, ණය දෙන ආයතන විසින් රුපියල් දශ ලක්ෂ 1.5 ක මුදලක් සඳහා ඉදිරිපත් කර තිබූ හිමිකම් 47 ක් මහ බැංකුව විසින් ගෙවනු ලැබ හෝ පිළිගනු ලැබ හෝ තිබුණු අතර හිමිකම් අයදුම්පත් දෙකක් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබිණ. රජයේ අයවැයෙහි අරමුදල් වෙන් කිරීමක් මගින් මෙකී ගෙවීම් පියවන ලදී. මෙම ක්‍රමය යටතේ වාර මුදල් වශයෙන් ලැබුණු රුපියල් 8,52,000 ක මුදලක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට වරින්වර බැර කරන ලදී.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක I ) ණය සහතික ක්‍රමය**

ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ 942 සීඊ ණය මාලාව ප්‍රයෝජනයට ගෙන අවසන් වීමත් සමඟ, 1984 අවසානයේදී සුමක I ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම අවසන් විය. මෙම ක්‍රමය යටතේ මහ බැංකුව රුපියල් දශ ලක්ෂ 284.1 ක් ආවරණය වන පරිදි, ණය සහතික 1,664 ක් නිකුත් කොට ඇත. 1985 දෙසැම්බර් අවසාන වනවිට, මෙම ණයවලින් රුපියල් දශ ලක්ෂ 51.2 ක වටිනාකමට වූ ණය මුදල් 691 ක් සම්පූර්ණයෙන් ආපසු අයකරගනු ලැබූ බව වාර්තා වී ඇත. 1985 අවසානයට රුපියල් දශ ලක්ෂ 105.8 ක නොපියවූ ණය ශේෂයන් සහිත ණය මුදල් 823 ක් නොබේරා ඉතිරිව තිබිණ. මේවායින් ණය මුදල් 504 ක් හෙවත් ණය මුදල් සංඛ්‍යාවෙන් සියයට 30 ක් හිඟ හිටුවා ඇති බව වාර්තා විය. 1985 අවසානයේ දී මහ බැංකුව විසින්, ණය දෙන ආයතන ඉදිරිපත් කළ රුපියල් දශ ලක්ෂ 6.5 ක වටිනාකමට වූ හිමිකම් පෑම් 95 ක් බේරන ලද අතර, රුපියල් දශ ලක්ෂ 1.66 ක වටිනාකමට වූ හිමිකම් පෑම් 10 ක් ප්‍රතික්ෂේප කරන ලදී. 1985 අවසානයට සුමක I යටතේ සහතික වාරිකයන් වශයෙන් රුපියල් දශ ලක්ෂ 7.8 ක් ලැබිණ.

## 2 . 4 සංඛ්‍යා සටහන

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රමය (1984 – 1985)
## (1985 දෙසැම්බර් 31 දක්වා)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සු. ම. ක.—I | | | | සු. ම. ක.—II | | | |
| | 1984 | | 1985 | | 1984 | | 1985 | | 1984 | | 1985 | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| අනුමත කරන ලද ණය | 767 | 31·2 | 767 | 31·2 | 1,657 | 282·3 | 1,664 | 284·1 | 372 (ඉ) | 141·0 | 831 | 382·3 |
| සහතික කරන ලද ණය | 767 | 23·4(අ) | 767 | 23·4(අ) | 1,657 | 155·5(ඇ) | 1,664 | 156·4(ඇ) | 372 | 77·4(ඇ) | 831 | 204·7(ඇ) |
| සම්පූර්ණයෙන් අය කර ගත් ණය .. | 441 | 11·4 | 508 | 17·2 | 476 | 28·6 | 691 | 51·2 | 11 | 1·3 | 23 | 4·1 |
| කල් ඉකුත් වූ/ ඉවත් කර ගන්නා ලද ණය සහතික .. | 61 | 3·6 | 62 | 3·6 | 45 | 11·4 | 45 | 11·4 | 15 | 2·4 | 23 | 6·9 |
| වගකීම් පිළිගත්තා/ පියවන ලද හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපිය වූ ණය .. | 35 | 1·25 | 47 | 2·0 | 50 | 3·04 | 95 | 10·835 | — | — | — | — |
| (ii) වගකීම් පිළිගත් .. | 35 | 0·75 | 47 | 1·5 | 50 | 1·82 | 95 | 6·502 | — | — | — | — |
| ප්‍රතික්ෂේප කරන ලද හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපිය වූ ණය .. | 1 | 0·2 | 2 | 0·22 | 5 | 1·58 | 10 | 2·83 | — | — | 2 | 0·23 |
| (ii) හිමිකම් පෑ ප්‍රමාණය .. | 1 | 0·15 | 2 | 0·16 | 5 | 0·88 | 10 | 1·66 | — | — | 2 | 0·1 |
| නොපිය වූ ණය .. | 229 | 6.09(ආ) | 148 | 3·6(ආ) | 1,081 | 151·5(ආ) | 823 | 105·8(ආ) | 346 | 116.5(ආ) | 783 | 371·4(ඇ) |
| (ඉන් හිඟ ණය) .. | 173 | 5·0 | 118 | 0·9 | 619 | 91·9 | 504 | 51·9 | 58 | 11·5 | 79 | 18·5 |
| නොපිය වූ ණය සහතික .. | 229 | 4.57 (අ) | 148 | 2·7(අ) | 1,081 | 86·6(ඇ) | 823 | 60·9(ඇ) | 346 | 65·2(ඇ) | 783 | 231·9(ඇ) |
| කටයුතු අවසන් නොවූ හිමිකම් පෑම් | | | | | | | | | | | | |
| (i) නොපිය වූ ණය .. | 23 | 1·41 | 13 | 0·4 | 88 | 16·3 | 69 | 14·1 | 3 | 0·22 | 5 | 0·52 |
| (ii) හිමිකම් පෑ ප්‍රමාණය .. | 23 | 1·06 | 13 | 0·3 | 88 | 9·8 | 69 | 8·5 | 3 | 0·13 | 5 | 0·31 |

(අ) නොපියවූ ණයවලින් සියයට 75 ක ප්‍රමාණය.

(ආ) අයකරගත් ණය වාරික හැර.

(ඇ) රුපියල් 4,00,000 උපරිමයකට යටත්ව නොපියවා පැවති ණයවලින් සියයට 60 ක ප්‍රමාණය.

(ඈ) රුපියල් 2,000,000 තෙක් වන ණය සඳහා රුපියල් 800,000 ක උපරිමයකටද, රුපියල් දශ ලක්ෂ 2·0 සිට රුපියල් දශ ලක්ෂ 4·0 දක්වා වන ණය සඳහා රුපියල් 1,200,000 ක උපරිමයකටද යටත්ව නොපියවා පැවැති ණය වලින් සියයට 60 ක ප්‍රමාණය.

(ඉ) 1985 වර්ෂය තුළදී සුමක I යෝජනා ක්‍රමයට මාරු කරන ලද ණය සහතික විම් 5 ක්ද ඇතුළුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සුමක I යටතේ දෙන ලද ණය, කර්මාන්ත අනුව වර්ග කොට 2.5 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

2 . 5 සංඛ්‍යා සටහන

සුමක I ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය

රුපියල් '000

| කර්මාන්තය | 1979—1985 ණය සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය |
|---|---|---|---|
| 1. වී කෙටීම .. | 352 | 53,510 | 31,500 |
| 2. ලුහු ඉංජිනේරු .. | 192 | 24,775 | 13,869 |
| 3. ගඩොල් සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 242 | 48,949 | 27,260 |
| 4. මසා නිම කළ ඇඳුම්, බතික්, අත්‍යන්ත්‍ර රෙදි, බුමුතුරුණු ආදිය | 141 | 21,342 | 11,125 |
| 5. රබර් හා රබර් උපයෝගි කරගත් භාණ්ඩ .. | 30 | 8,794 | 4,397 |
| 6. පාවහන් සහ අනෙකුත් සම් භාණ්ඩ .. | 22 | 3,452 | 1,821 |
| 7. හකුරු සහ උක් නිෂ්පාදන .. | 6 | 198 | 119 |
| 8. ගෘහභාණ්ඩ හා අනෙකුත් දව භාණ්ඩ .. | 80 | 9,806 | 5,579 |
| 9. කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන .. | 96 | 8,901 | 5,321 |
| 10. ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් කඩදාසි නිෂ්පාදන .. | 27 | 4,636 | 2,582 |
| 11. ආහාර සහ පාන වර්ග .. | 80 | 13,202 | 6,953 |
| 12. තීන්ත, පොලිෂ්, වාර්නිෂ් ආදිය .. | 16 | 5,503 | 2,967 |
| 13. ගුවන් විදුලි යන්ත්‍ර සහ පාපැදි සඳහා අමතර කොටස් .. | 11 | 725 | 435 |
| 14. සබන් සහ අනෙකුත් සුවඳ විලවුන් වර්ග .. | 30 | 2,004 | 1,177 |
| 15. හස්ත කර්මාන්ත සහ සෙල්ලම් බඩු .. | 29 | 951 | 571 |
| 16. සුරුට්ටු සහ බීඩි .. | 6 | 48 | 29 |
| 17. ධීවර යාත්‍රා සහ මිරිදිය ධීවර කටයුතු .. | 14 | 11,100 | 4,700 |
| 18. ස්වර්ණාභරණ සහ මැණික් .. | 15 | 944 | 566 |
| 19. ක්‍රීඩා භාණ්ඩ .. | 2 | 80 | 48 |
| 20. කෘෂි උපකරණ .. | 13 | 2,213 | 1,128 |
| 21. වීදුරු සහ අනෙකුත් වීදුරු භාණ්ඩ .. | 6 | 1,051 | 631 |
| 22. පිත්තල සහ ඇලුමිනියම් භාණ්ඩ .. | 44 | 6,850 | 3,370 |
| 23. ලී ඉරීම .. | 51 | 10,613 | 6,345 |
| 24. මුද්‍රණ කටයුතු .. | 43 | 12,706 | 6,831 |
| 25. විවිධ .. | 116 | 31,763 | 17,089 |
| එකතුව .. | 1,664 | 2,84,116 | 1,56,413 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**සුළු හා මධ්‍ය පරිමාණ (සුමක II) ණය සහතික ක්‍රමය**

1982 දී ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා. සං. ස.) විසින් ප්‍රදනය කරන ලද එ. ජ. ඩොලර් දශ ලක්ෂ 30 ක දෙවැනි සුමක ණය මාලාව මුල් වර්ෂවලදී ප්‍රයෝජනයට ගැණුනේ මඳ වශයෙනි. එහෙත්, උපරිම ණය සීමාව රුපියල් දශ ලක්ෂ 2 සිට රුපියල් දශ ලක්ෂ 4 දක්වා වැඩි කිරීමත්, සහභාගි වන ණය දෙන ආයතනවලට පුළුල් පොළී පරතරයක් පිරිනැමීමත් නිසා ණය අනුමත කිරීම් ශීඝ්‍රයෙන් වැඩි විය. මේ අනුව, මහ බැංකුව විසින් නිකුත් කරන ලද ණය සහතික සංඛ්‍යාව, රුපියල් දශ ලක්ෂ 382.3 ක ණය ආවරණය වන පරිදි 831 දක්වා වැඩි විය. 1985 අවසානය වනවිට ණය මුදල් 23 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා තිබුන අතර, ණය මුදල් 79 ක ණය බේරීමට ඉතිරිව තිබුණි. සහභාගි වූ ණය දෙන ආයතන විසින් රුපියල් දශ ලක්ෂ 0.31 ක වටිනාකමට ඉදිරිපත් කරන ලද හිමිකම් 5 ක් සැළකිල්ලට භාජනව පවතී. සුමක II යටතේ දෙන ලද ණය කර්මාන්ත අනුව වර්ග කොට 2.6 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ.

## 2 . 6 සංඛ්‍යා සටහන
## සුමක 11 යෝජනා ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය

රුපියල් '000

| කර්මාන්තය | 1982—1985 | | | 1985 | | |
|---|---|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය |
| 1. ආහාර සකස් කිරිම .. | 248 | 1,18,320 | 62,674 | 148 | 81,630 | 42,800 |
| 2. වෙනත් කෘෂි කර්මාන්ත | 24 | 8,673 | 4,484 | 12 | 2,059 | 1,235 |
| 3. රබර් නිෂ්පාදන .. | 32 | 21,432 | 10,639 | 17 | 13,535 | 6,671 |
| 4. ලෝහ නිෂ්පාදන .. | 97 | 34,493 | 18,196 | 43 | 22,557 | 10,989 |
| 5. ඉදිකිරීමේ ද්‍රව්‍ය .. | 56 | 29,284 | 16,855 | 30 | 17,564 | 10,203 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු | 4 | 5,575 | 2,785 | 4 | 5,575 | 2,785 |
| 7. දැව නිෂ්පාදන .. | 71 | 21,814 | 12,633 | 33 | 12,072 | 6,788 |
| 8. මසා නිමකළ ඇඳුම් .. | 56 | 23,253 | 13,175 | 27 | 9,728 | 6,077 |
| 9. රෙදිපිළි .. | 20 | 8,053 | 4,832 | 8 | 3,083 | 1,850 |
| 10. අළුත් වැඩියා කිරීමේ වැඩ පොළවල් .. | 25 | 7,795 | 4,677 | 19 | 6,270 | 3,762 |
| 11. වෙනත් .. | 198 | 1,03,594 | 53,715 | 118 | 67,229 | 34,052 |
| එකතුව .. | 831* | 3,82,286 | 2,04,665 | 459 | 2,41,302 | 1,27,212 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* 1984 දී සහතික කරන ලදුව, 1985 දී සුමක – I ට මාරු කරන ලද රුපියල් දශ ලක්ෂ 1·49 වූ ණය 5 ක් හැර.

### ග්‍රාමීය ණය

මෑත වර්ෂවලදී මහ බැංකුව, මෙහෙයවීම් සහ අධීක්ෂණය කිරීමෙන් බැංකු ක්‍රමයේ ග්‍රාමීය ණය පිළිබඳ කටයුතුවලට ක්‍රියාශීලී ලෙස සහභාගි විය. ග්‍රාමීය ණය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීමෙහිලා බැංකුව වැදගත් කාර්ය භාරයක් ඉටු කළේය. ග්‍රාමීය ණය ක්‍රමය කාර්යක්ෂම ලෙස මෙහෙයවීමට අවශ්‍ය ස්ථිර ආයතනික රාමුවක් සකස් කිරීම ප්‍රධාන අරමුණ විය. ග්‍රාමීය ක්ෂේත්‍රයට ණය සැපයීම පිළිබඳ මදිපාඩු සපුරාලීම සඳහා 1985 වර්ෂය තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හතරක් පිහිටුවනු ලැබීය.

ග්‍රාමීය ණය සම්බන්ධයෙන්, බැංකුව සම්බන්ධ වූ අතිශයින් වැදගත් ක්ෂේත්‍රයන් වූයේ, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සංවිධානය කිරීම සහ මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමයේ අනුග්‍රහය ලත් නොයෙක් ණය ක්‍රම යටතේ බැංකු විසින් ප්‍රදානය කරන ලද, කෙටිකාලීන වගා ණය හා මැදි හා දිගු කාලීන ණය සඳහා ණය සහතික ක්‍රම සංවිධානය කිරීමත්ය. 1986 වර්ෂයේ සිට මෙම ක්‍රම දෙක ක්‍රියාත්මක වනු ඇත.

ලබාගත හැකි ණය ප්‍රමාණය වැඩි කිරීම, ණය පරිහරණය පිළිබඳ අධීක්ෂණ කටයුතු උසස් තත්ත්වයකට ගෙන ඒම හා ණය ආපසු ලබා ගැනීමේ ප්‍රගතිය වැඩි කිරීමේ අදහසින්, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ, පෙර පැවති සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයට අංශ කීපයකින් නව මුහුණුවරක් දී ඇත. හැම කන්නයක් මුලදීම ණය ඉල්ලුම්පත් නැවත නැවතත් බාරදීම වැළැක්වීම පිණිස, ණය ලබා ගන්නකුට නව ක්‍රමය යටතේ තුන් අවුරුදු කාලයක් සඳහා ණය මුදලක් බැංකුවට අනුමත කළහැකිය. නව ක්‍රමය යටතේ ගොවි සමාජයනට නිෂ්පාදන ණය දීමේදී ක්ෂේත්‍රය පිළිබඳ විමසිලිමත්වීම බැංකුවලින් අපේක්ෂා කෙරේ. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී, සකසුරුවම් හා ණය සමූපකාර සමිති සහ විවිධ සේවා සමූපකාර සමිති සුළු කොටස්කරුවන් වශයෙන් ඇතුළත් කිරීම මෙහි තවත් නව ලක්ෂණයකි. ස්වාභාවික ආපදවන් නිසා ආපසු ගෙවීම් පැහැර හැර ඇති ණය, නැවත ලේඛනගත කිරීම සඳහාද, මෙම යෝජනා

ක්‍රමය මගින් ඉඩ සළසා ඇත. එලෙස නැවත ලේඛනගත කරන ලද ණය සඳහා මහ බැංකුව වසරකට සියයට 1.5 බැගින් ප්‍රතිමූල්‍ය සපයයි. තවද, ණය ආපසු ගෙවීමේ කාර්යය, අතීතයේදී මනා ලෙස ඉටුකර ඇති ණය ගැනුම්කරුවන්ට රු. 7,500 ක උපරිමයක් දක්වා ඇපයකින් තොරව වගා ණය ලබා දීමට බැංකුවලට බලය දී ඇත. එසේම, යෝජනා ක්‍රමය සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා, වාර්තා සපයන ක්‍රමයක් යෝජනා ක්‍රමයට අන්තර්ගත කරනු ලැබ ඇති අතර, එය යෝජනා ක්‍රමය යටතේ ණය දීම් පිළිබඳ දත්ත පරිගණක ගත කිරීම සඳහා පසුබිමද වේ. සාමාන්‍ය ණය ක්‍රමය යටතේ ණය දීමේදී බැංකුවලට දැරීමට සිදුවන පාඩු වලින් සියයට 50 ක් දක්වා මෙම ණය සහතික ක්‍රමය යටතේ සහතික කරනු ලැබේ. එසේ වුවද, මෙහි උපරිම ණය ආවරණය එක් ණය මුදලකට රු. 25,000 කට සීමාවනු ඇත. මෙම කාර්යය සඳහා රුපියල් දශ ලක්ෂ 300 ක මූලික වෙන් කිරීමක් සහිත ණය සහතික අරමුදලක් මහ බැංකුව විසින් පිහිටුවා ඇත.

විමර්ශණයට අදළ වර්ෂය තුළදී ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය හය වරක් රැස් විය. මෙම රැස්වීම් වලදී, ග්‍රාමීය ණය සහ ග්‍රාමීය සංවර්ධනයට අදළ වැදගත් ප්‍රශ්න කීපයක් සාකච්ඡාවට භාජනය විය. මාතර සුළු ගොවි සංවර්ධන ව්‍යාපෘතිය, කල් ඉකුත් වූ වගා ණය නැවත ලේඛනගත කිරීමේ ක්‍රමය, ධීවර අංශයේ බැංකු ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රදනය කරන ලද ණය නැවත ලේඛනගත කිරීම, ග්‍රාමීය අංශයේ ඉතිරි කිරීම් එක්රැස් කිරීම, සීට්ටු ක්‍රමය සංවිධානාත්මක ලෙස කිරීම සහ ශ්‍රී ලංකාවේ ගොවිපොළවල් සඳහා දෙනු ලබන ණය යනාදිය සාකච්ඡාවට භාජනය කරන ලද ප්‍රශ්නවලින් සමහරකි. මාතලේ දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, රෝද දෙකේ ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා දෙන ලද ණය සහ ලංකා බැංකුව විසින් දියත් කරන ලද වගා ණය සඳහා වූ නැවත ලේඛනගත කිරීමේ ක්‍රමය පිළිබඳ විමර්ශණ වාර්තා ද ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් විභාග කරන ලදී.

ග්‍රාමීය අංශයට මැදි හා දිගු කාලීන ණය පහසුකම් සැපයීම පිණිස වර්ෂය තුළදී, නව ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දෙන ලද අතර, පැරණි යෝජනා ක්‍රම සමහරකට නව මුහුණුවරක් දෙනු ලැබීය. ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය මගින් සෝයා බෝංචි සහ බඩ ඉරිඟු මිළදී ගැනීම පහසු කිරීම සඳහා මහ බැංකුව විසින් අලෙවි ණය ක්‍රමයක්ද හඳුන්වා දෙනු ලැබීය.

මැදි හා දිගු කාලීන ණය අරමුදලේ I වැනි කාණ්ඩය යටතේ ඇති මැදි හා දිගු කාලීන ණය යෝජනා ක්‍රමවල ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රගතිය 2.7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ඉහත සඳහන් යෝජනා ක්‍රම යටතේ ප්‍රතිමූල්‍ය ලබා දීම සඳහා වර්ෂය අවසාන වනවිට මහ බැංකුව විසින් වෙන් කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1,039.76 ක්ව පැවතුණි. මෙයින් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ රුපියල් දශ ලක්ෂ 347.23 ක් නොහොත් සියයට 33.4 ක් පමණි. මෙම මන්දගාමී ප්‍රගතියට, ණය සඳහා ඉල්ලුමක් නැතිකම, රටේ සමහර පෙදෙස්වල පැවති කලබලකාරී තත්ත්වය, යෝජනා ක්‍රම සම්බන්ධයෙන් අවශ්‍ය තරම් ප්‍රචාරයක් නොදීම, මෙහෙයුම් කටයුතු පිළිබඳ අපහසුකම් සහ ණය ලබා දීම සම්බන්ධයෙන් පැවති අඩුලුහුඩුකම් යනාදී කරුණු හේතු විය. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ ආයතන අතර සඵල සම්බන්ධීකරණයක් නැති වීම තවත් හේතුවක් විය හැක.

අවුරුද්දේ පසු භාගයේදී හඳුන්වා දෙන ලද හෙයින්, අනුරාධපුර වියළි කලාපීය කෘෂි ව්‍යාපෘතිය සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ චීන ඉඟුරු, අන්නාසි සහ වැල් දෙඩම් වගාව සඳහා වූ ණය ක්‍රමය ආදී සමහර නව යෝජනා ක්‍රම මූල්‍යකරණයෙන් බලාපොරොත්තුවූ තරම් ප්‍රගතියක් වාර්තා නොවීය. කෙසේ වුවද, රෝද දෙකේ ට්‍රැක්ටර් වැනි නිරතුරු ඉල්ලුමක් පැවති අයිතමයන් සඳහා ණය පහසුකම් ලබා දීමේ යෝජනා ක්‍රමවල සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබිණ.

## මැදි හා දිගු කාලීන ණය අරමුදලේ
## සඳහා අනුමත කරන ලද

| ණය යෝජනා ක්‍රමයේ නම | වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය (රු. දශ ලක්ෂ) |
|---|---|
| **(අ) 1985 වර්ෂය ආරම්භයේදී තිබූ ණය යෝජනා ක්‍රම** | |
| 1· උඩවැඩියා වගාව සඳහා ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව/සීමාසහිත ලංකා දුම්කොළ සමාගම .. .. .. | 4·50 |
| 2· පොල් පොහොර ණය යෝජනා ක්‍රමය .. .. .. | 55·00 |
| 3· ධීවර අංශය සඳහා බැංකු ණය යෝජනා ක්‍රමය .. .. | 140·00 |
| 4· වැව් වාරිමාර්ග නවීකරණ යෝජනා ක්‍රමය .. .. | 7·69 |
| 5· නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරි පට්ටි පාලන සංවර්ධන ණය යෝජනා ක්‍රමය .. | 10·00 |
| 6· කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ගොවිපොළ යන්ත්‍ර උපකරණ සඳහා වන ණය යෝජනා ක්‍රමය .. | 76·5 |
| 7· සමන්තුරේ මැතිවරණ කොට්ඨාශය තුළ කිරිපට්ටි පාලන සංවර්ධන (නියමු) ණය යෝජනා ක්‍රමය. .. .. .. | 0·12 |
| 8· මහවැලි සංවර්ධන ව්‍යාපාරය තුළ පදිංචිකරුවන්ට ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා වන ණය යෝජනා ක්‍රමය .. .. . | 55·00 |
| 9· විවිධ සේවා සමුපකාර සමිති විසින් ඉදිකරන පොහොර ගබඩා සඳහා ණය යෝජනා ක්‍රමය .. .. .. .. | 14·00 |
| 10· වයඹ දිග වෙරලේ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අබුඩාබි රජයෙන් ආධාර ලබන ණය යෝජනා ක්‍රමය .. .. .. | 60·00 |
| 11· උඩවැඩියා වගාව සඳහා වන ණය යෝජනා ක්‍රමය මහජන බැංකුව/ සර්වෝදය / ලක්මල්සල .. .. .. .. | 3·00 |
| 12· ධීවර සමුපකාර සඳහා ණය යෝජනා ක්‍රමය .. .. | 42·00 |
| 13· මාතලේ / පුත්තලම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය .. | 54·79 |
| 14· සුළංබල යන්ත්‍ර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 2·56 |
| 15· මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා යෝජනා ක්‍රමය .. | 8·20 |
| 16· ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය .. .. .. | 137·00 |
| 17· කුඩා තේ ඉඩම් හිමියන් සඳහා වන පොහොර ණය යෝජනා ක්‍රමය .. | 7·50 |
| 18· ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන දිස්ත්‍රික්ක සඳහා බර අදින සතුන් මිළදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය. .. .. .. | 5·60 |
| 19· ගම් නගා සිටුවීම හා ස්වයං රැකියා වැඩ පිළිවෙල යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනා ගන්නා ලද ව්‍යාපෘති සඳහා මූල්‍ය සහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. .. .. | 6·00 |
| 20· ගොවිපොළවල පවත්වාගෙන යනු ලබන කුඩා පරිමාණයේ බීජ අර්තාපල් ගබඩා ඉදිකිරීම සඳහා ණය යෝජනා ක්‍රමය .. .. | 1·00 |
| 21· බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය .. | 7·00 |
| 22· මාදැල් මගින් මසුන් ඇල්ලීමේ ණය යෝජනා ක්‍රමය .. .. (වෙරලේ සිට දැල් ඇදීම) | 5·00 |
| 23· පැල්වත්ත සීනි ව්‍යාපෘතිය යටතේ උක් වවන්නන් සඳහා ඇති ණය ක්‍රමය .. | 66·00 |
| 24· වවුනියා – මන්නාරම දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. | 32·00 |
| 25· සෙවනගල, හිඟුරාණ සහ කන්තලේ සීනි ව්‍යාපෘති යටතේ උක් වගා කරන්නන් සඳහා ඇති ණය යෝජනා ක්‍රමය .. .. | 120·60 |
| 26· රඹුක්කන ප්‍රදේශයේ පොල් වවන්නන්ට අතුරු වගාව හා නැවත වගාව සඳහා දෙනු ලබන ශ්‍රී ලංකා / ආ. සං. බැ. පොල් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. .. .. | 8·00 |
| **(ආ) 1985 වර්ෂය තුළදී අනුමත කරන ලද ණය යෝජනා ක්‍රම** | |
| 1· වික්ටෝරියා ව්‍යාපෘතිය යටතේ තැන් අහිමිවූ වෙළෙඳුනට වාණිජ ගොඩනැගිලි මිළදී ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 22·00 |
| 2· තෙත් කලාපිය දිස්ත්‍රික්ක සහ මොනරාගල දිස්ත්‍රික්කය තුළ රෝද දෙකේ ට්‍රැක්ටර් මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය .. .. | 33·00 |
| 3· ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ / කාන්තා කාර්යාංශ ව්‍යාපෘතිය යටතේ ආදායම් ඉපැයීමේ කටයුතුවල නියැලීම සඳහා වතු අංශයේ කාන්තාවනට සහායවීමේ සමාජ සේවා ණය යෝජනා ක්‍රමය .. .. | 1·00 |
| 4· කුරුණෑගල දිස්ත්‍රික්කයේ චීන ඉඟුරු, අන්නාසි සහ වැල් දෙඩම් වගාව සඳහා ණය යෝජනා ක්‍රමය .. .. .. | 32·00 |
| 5· අනුරාධපුර වියලි කලාපිය කෘෂි ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. | 22·30 |
| 6· මිනිපේ යෝජනා ක්‍රමයේ පදිංචිකරුවනට ජීවවායු, යන්ත්‍ර සූත්‍ර සවිකිරීම සඳහා සහයවීමේ ණය යෝජනා ක්‍රමය .. .. .. | 0·40 |
| එකතුව | 1,039·76 |

**2.7 සංඛ්‍යා සටහන**

## 1 වැනි කාණ්ඩය යටතේ ප්‍රතිමූල්‍යනය ලද ණය ක්‍රම

| 85·12·31 වන දිනට ඉන් ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය (රු. දශ. ලක්ෂ) | 85.12.31 වන දිනට ඉන් ප්‍රයෝජනයට නොගෙන තිබූ ප්‍රමාණය (රු. දශ. ලක්ෂ) | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රයෝජනයට ගත හැකි කාලය (අවුරුදු) |
|---|---|---|---|
| 3·49 | 1·01 | 03·02·79 | 3 |
| 42·63 | 12·37 | 26·03·79 | 3 |
| 109·76 | 30·24 | 02·07·79 | 3 |
| 7·69 | — | 02·06·79 | 1 |
| 9·32 | 0·68 | 22·08·79 | 3 |
| 54·25 | 22·25 | 28·10·79 | 5 |
| — | 0·12 | 27·11·79 | 3 |
| 6·01 | 48·99 | 19·11·79 | 3 |
| 9·14 | 4·86 | 13·10·80 | 1 |
| — | 60·00 | 13·10·80 | 3 |
| 0·23 | 2·77 | 10·12·80 | 5 |
| 0·33 | 41·67 | 28·04·81 | 2 |
| 35·51 | 19·28 | 08·05·81 | 6 |
| 1·05 | 1·51 | 11·12·81 | 1 |
| 4·53 | 3·67 | 10·04·81 | — |
| 53·33 | 83·67 | 01·07·82 | 1 |
| 0·85 | 6·65 | 11·08·82 | 1 |
| 0·01 | 5·59 | 10·09·82 | 2 |
| 1·75 | 4·25 | 14·10·82 | 2 |
| — | 1·00 | 01·03·83 | 1 |
| 1·91 | 5·09 | 27·09·83 | 5 |
| 0·52 | 4·48 | 26·04·84 | 1 |
| — | 66·00 | 10·05·84 | 6 |
| 0·27 | 31·73 | 14·06·84 | 4 |
| 2·91 | 117·69 | 20·09·84 | 5 |
| 0·04 | 7·96 | 26·12·84 | 3 |
| — | 22·00 | 11·03·85 | 2 |
| 1·49 | 31·51 | 26·03·85 | 2 |
| 0·21 | 0·79 | 31·12·85 | 1 |
| — | 32·00 | 27·06·85 | 3 |
| — | 22·30 | 02·07·85 | 3 |
| — | 0·40 | 16·09·85 | 1 |
| 347·23 | 692·53 | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මහ බැංකුවේ සම්බන්ධීකරණය ඇතිව, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරය ලැබූ, ශ්‍රී ලංකා ග්‍රාමීය ණය ව්‍යාපෘතිය, විමර්ශනයට අදාළ වර්ෂය තුළදී සතුටුදායක ප්‍රගතියක් පෙන්වීය. රෝද දෙකේ ට්‍රැක්ටර් 1,000 ක් සැපයීම සඳහා, ශ්‍රී ලංකා රාජ්‍ය (ට්‍රැක්ටර්) නීතිගත සංස්ථාව සමඟ පැවති මුල් ගිවිසුම යටතේ නැවත වරක් ඉල්ලුම් කළ අතර, 1985 පෙබරවාරි මාසය වනවිට සංස්ථාව ඒවා ආනයනය කර තිබුණි. ට්‍රේලර් සැපයීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලද අතර, ඒ අනුව ට්‍රේලර් නිෂ්පාදකයින් පස් දෙනෙක් බලය ලත් සැපයුම්කරුවන් වශයෙන් මෙකී ක්‍රමය යටතේ ලියාපදිංචි කරන ලදී. ඔවුන්ගේ අභිමතය පරිදි ඔවුන් කැමති ට්‍රේලර් වර්ගය බලය ලත් සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීමේ අයිතිය ණය ලබා ගන්නන්ට ලබා දී ඇත. බලය ලත් එක් සැපයුම්කරුවකු පමණක් සිටි අවධියේදී පැවති අඩු සැපයුම පිළිබඳ ප්‍රශ්නය මේ නව ක්‍රමය නිසා නිරාකරණය විය.

ගොවීන් විසින් ඉල්ලුම් කරන ලද ගොයම් මඩින යන්ත්‍ර 200 ක් ලබා ගැනීම සඳහා හාල් මෝල් වෙනුවෙන් වෙන් කළ මුදල් වලින් කොටසක් මාරු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය වර්ෂය තුළදී ලබා ගන්නා ලදී. ට්‍රේලර් සැපයීම සම්බන්ධයෙන් බලය ලත් සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙත මේ සම්බන්ධයෙන් ද උපයෝගි කර ගනු ලැබිය. වර්ෂය තුළදී ලබා ගන්නා ලද අමතර රෝද දෙකේ ට්‍රැක්ටර් 1,000 මූල්‍යකරණය, වර්ෂය අවසානය වනවිට සම්පූර්ණ වීමට ආසන්නව පැවතිණ. ගොයම් මඩින යන්ත්‍ර මිළදී ගැනීම සඳහා ණය දීම වර්ෂය තුළදී කරගෙන යනු ලැබූ අතර, ගොයම් කපන කාලය පටන් ගන්නා විට, 1986 මුල් අවධියේදී මේ අංශයෙහි සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කෙරේ යයි බලාපොරොත්තු වේ. ප්‍රාග්ධන වියදම වැඩි වීමත්, සමහර දිස්ත්‍රික්ක තුළ පැවති කලබලකාරී තත්ත්වයත් නිසා නළ ළිං තැනීම මූල්‍යකරණය සතුටුදායක නොවීය. ව්‍යාපෘතිය අවසන් කළයුතු දිනය 1986 ජූනි මස 30 වැනි දින දක්වා දීර්ඝ කර ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය ලබා දීමේ දැනට පවත්නා ක්‍රියාවලිය උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා අනුගමනය කළයුතු වැඩපිළිවෙල සහ ගොවිපොළ තුළ හා ගොවිපොළෙන් පිටත ආයෝජන අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක් ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයන් විසින් කරන ලදුව, ඔවුන්ගේ වාර්තාව ආසියානු සංවර්ධන බැංකුවට වර්ෂයේ අවසාන භාගයේ දී ඉදිරිපත් කරන ලදී.

රත්නපුර, කෑගල්ල, හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල පිහිටි මහජන බැංකු ශාඛා හතක්ද, ලංකා බැංකු ශාඛා හතරක්ද, එක් සමූපකාර ග්‍රාමීය බැංකුවක්ද ඇතුළු බැංකු ශාඛා 12 ක කෘෂි ණය කටයුතු පරීක්ෂා කිරීම, මහ බැංකුව විසින් 1985 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. අඩුපාඩුකම් සකස්කර ගැනීම සඳහා නිසි නිර්දේශද සහිතව, පරීක්ෂණ වාර්තා අදාළ බැංකුවලට සහ බැංකු ශාඛාවලට යවන ලදී. එම නිර්දේශ ක්‍රියාත්මක කළ බවට මහ බැංකුවට වාර්තා කරන ලෙසට ඉල්ලීමක් ද කෙරිණ.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනතින් තමන් වෙත පැවරී ඇති බලතල යටතේ, මුදල් මණ්ඩලය විසින්, බුලත්සිංහල, කුලියාපිටිය, යටියන හා මිහින්තලේ ප්‍රධාන ව්‍යාපාර ස්ථාන වශයෙන් ගෙන පිළිවෙලින් කළුතර, කුරුණෑගල, මාතර හා අනුරාධපුරය

යන එක් එක් දිස්ත්‍රික්කය සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවමින්, නීතිගත කිරීමේ නියෝග හතරක් නිකුත් කරන ලදී. 1985 ජූනි මස රජයේ ගැසට් පත්‍රයෙහි මේවා පළ කරනු ලැබීය.

මෙකී බැංකු, වාණිජ මෙන්ම සංවර්ධන කටයුතුවලද නිරත වනු ඇත. ඒ අතරම, මේවා දිස්ත්‍රික්ක මට්ටමේ බැංකු ඒකක වන අතර, කටයුතු හා කළමණාකරණය සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීන තත්ත්වයෙන් යුක්ත වේ. මේ අනුව, ඒ ඒ ප්‍රදේශයට විශේෂ වූ ප්‍රාදේශීය ලක්ෂණ පවත්වා ගන්නා අතරම, ප්‍රාදේශීය අවශ්‍යතාවලට මුල් තැන දීමටද එකී බැංකු වලට හැකිවනු ඇත.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක අනුමත කරන ලද කොටස් ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 50 කි. රුපියල් 100 කොටස් 5,00,000 කින් එය සමන්විත වෙයි. නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 10 ක් වන අතර, එයට සම්පූර්ණයෙන්ම දායකවී ඇත්තේ මහ බැංකුවයි. නීතිගත කොට වසර දෙකක කාලයක් ඉක්ම ගිය පසු, නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 49 ක් දක්වා දේශීය වාණිජ බැංකු වලට සහ සමූපකාර සමිතිවලට පිරිනැමීමට මහ බැංකුවට හැකියාවක් ඇත.

සෑම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක්ම, සභාපතිවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් පස් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය කෙරේ. ඉන් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත් කරනු ලබන්නේ මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය මගිනි. අනෙක් අධ්‍යක්ෂවරුන් දෙදෙනා මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර, පසු අවස්ථාවකදී බැංකුවේ මහා සභාව මගින් තෝරා පත්කර ගනු ලබනවා ඇත. ඇමතිවරයාගේද එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනෙකු සභාපති වශයෙන් පත්කර ගනු ලැබේ.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල පරමාර්ථ වනුයේ, කෘෂිකර්මාන්තය, ගෘහ හා කුඩා පරිමාණයේ කර්මාන්ත, ධීවර කර්මාන්තය, වාණිජ කටයුතු සහ ග්‍රාමීය ප්‍රදේශවල වෙනත් සංවර්ධන කටයුතු දියුණු කිරීම සඳහා අතදීමෙන් ගැමි ආර්ථිකය නංවාලීමය.

විදේශ විනිමය කටයුතු හැර, අනෙකුත් බැංකු කටයුතු කරගෙන යාමට සෑම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවකටම බලය පවරා ඇත. මීට අමතරව, වෙනත් කරුණු අතර, විශේෂයෙන් ගොවීන්ට, කෘෂිකර්මාන්තයේ නියුතු කම්කරුවන්ට, පුහුණු කාර්මිකයිනට සහ ගෘහ කර්මාන්ත, වෙළෙඳ හා වාණිජ කටයුතුවල හෝ කර්මාන්තවල හෝ වෙනත් ආකාරයේ සංවර්ධන කටයුතුවල නියුතු අනෙකුත් පුද්ගලයින්ට තනිතනිව හෝ සමූහ වශයෙන්, කෙටි කාලීන, මැදිකාලීන සහ දිගු කාලීන හා වෙනත් ණය දීමට හැකිය. එහෙත්, එම කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ප්‍රකාර කුඩා පරිමාණ ස්වභාවයකින් යුක්ත විය යුතුය.

1985 වර්ෂය අවසාන වනවිට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ඔවුන්ගේ ශාඛා පද්ධතිය වැඩි කරලීය. සෑම ඡන්ද කොට්ඨාශයකම මුලදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා එක බැගින් පිහිටුවීමට අදහස් කොට ඇත. පුහුණු නිලධාරීන් හා කාර්යාල ඉඩකඩ ලබාගත හැකිවීම සහ වෙනත් කරුණු මත ශාඛා ව්‍යාප්තිය රඳා පවතී.

1985 දී විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව මෙසේය :

| බැංකුවේ නම | | ශාඛා සංඛ්‍යාව |
|---|---|---|
| කළුතර ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 5 |
| මාතර ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 6 |
| කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 7 |
| අනුරාධපුර ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 3 |

1985 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් එක්රැස් කරන ලද තැන්පතු 2.8 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 8 සංඛ්‍යා සටහන**

**1985 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රා. ග්‍රා. සං. බැංකු මගින් එක්රැස් කරන ලද තැන්පතු**

| ප්‍රා. ග්‍රා. සං. බැ. නම | ඉතිරි කිරීමේ තැන්පතු | | ස්ථිර තැන්පතු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගිණුම් සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් | ගිණුම් සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් | ගිණුම් සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් |
| මාතර ප්‍රා. ග්‍රා. සං. බැ. | 3,472 | 11,33,883 | 5 | 51,000 | 3,477 | 11,84,883 |
| කළුතර ප්‍රා. ග්‍රා. සං බැ. | 2,845 | 7,27,650 | 15 | 1,80,500 | 2,860 | 9,08,150 |
| කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං බැ. | 4,786 | 9,05,882 | 10 | 50,000 | 4,796 | 9,55,882 |
| අනුරාධපුර ප්‍රා ග්‍රා. සං. බැ. | 1,382 | 3,36,154 | 3 | 28,750 | 1,385 | 3,64,904 |
| එකතුව | 12,485 | 31,03,569 | 33 | 3,10,250 | 12,518 | 34,13,819 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1985 දෙසැම්බර් 31 වැනි දින වනවිට ප්‍රා. ග්‍රා. සං. බැ. හතර විසින් ගිණුම් 12,518 ක රුපියල් 34,13,819 ක තැන්පතු එක්රැස් කර තිබුණි. මෙම සංඛ්‍යාවෙන් 12,485 හෝ සියයට 99.7 ක් රුපියල් 31,03,569 ක ඉතිරි කිරීම් තැන්පතුවලින් සමන්විත විය. ඉතිරි කිරීම් සහ ස්ථිර තැන්පතු ගිණුම්වල පැවති සාමාන්‍ය මුදල් ප්‍රමාණයන් පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

| බැංකුවේ නම | | ඉතිරි කිරීමේ තැන්පතුවල සාමාන්‍ය ප්‍රමාණය (රුපියල්) | ස්ථිර තැන්පතුවල සාමාන්‍ය ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|---|
| මාතර ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 326 | 10,200 |
| කළුතර ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 255 | 12,033 |
| කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 189 | 5,000 |
| අනුරාධපුර ප්‍රා. ග්‍රා. සං. බැ. | ... | 243 | 9,583 |
| සියළු බැංකු සඳහා සාමාන්‍යය | ... | 248 | 9,401 |

ඉතිරි කිරීම් තැන්පතු බොහෝ සෙයින්ම පලාත්වාසීන්ගේ සුළු ඉතිරිකිරීම් වලින් සැදී ඇති බව මෙම සංඛ්‍යා සටහනින් පෙනේ. බලතල පැවරී ඇති නමුදු, මහජනතාවගෙන් ඉල්ලුම් තැන්පතු බාර ගැනීම ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් තවමත් සිදුකර නොමැත. ඉතිරි කිරීම් තැන්පතු කුඩා වීමට මෙම කරුණ ද තරමක් දුරට හේතු වූවා විය හැකිය.

1985 දෙසැම්බර් 31 වනි දිනට ප්‍රා. ග්‍රා. සං. බැංකුවල ණය කොටස් ප්‍රමාණය 2.9 සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

**2 . 9 සංඛ්‍යා සටහන**

**1985 දෙසැම්බර් මස 31 වැනි දිනට දෙන ලද/අනුමත කරන ලද ණය මුදල්**

| අරමුණ | මාතර ප්‍රා. ග්‍රා. සං. බැ. | | කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං. බැ. | | කළුතර ප්‍රා. ග්‍රා. සං. බැ. | | අනුරාධපුර ප්‍රා. ග්‍රා. සං. බැ. | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) |
| 1. කෘෂිකර්මය | | | | | | | | |
| 1·1 වගා .. | 113 | 2,07,325 | 32 | 3,57,010 | 84 | 75,058 | 111 | 7,88,034 |
| 1·2 ගොවි උපකරණ | 7 | 19,500 | 4 | 25,475 | — | — | 17 | 4,86,500 |
| 1·3 වෙනත් .. | 9 | 9,189 | — | — | 18 | 59,397 | — | — |
| 2. පශු සම්පත් .. | 5 | 28,500 | 31 | 3,21,150 | 31 | 1,23,200 | 10 | 80,900 |
| 3. කුඩා කර්මාන්ත .. | 112 | 93,990 | 41 | 4,06,100 | 100 | 4,04,165 | 14 | 95,000 |
| 4. වෙළෙඳ ව්‍යාපාර .. | 171 | 2,22,530 | 15 | 1,16,000 | 89 | 3,34,932 | 12 | 1,16,500 |
| 5. වෙනත් .. | 65 | 2,06,134 | — | — | 13 | 1,57,400 | 10 | 1,14,275 |
| එකතුව | 482 | 7,87,168 | 123 | 12,25,735 | 335 | 11,54,152 | 164 | 16,81,209 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් 48,48,264 ක මුළු මුදලක් ණය 1,104 ක් වෙනුවෙන් ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් 1985 දෙසැම්බර් 31 වැනි දිනට දී තිබුණි. එක් එක් බැංකුව විසින් දී තිබුණු ණය මුදල්වල සාමාන්‍ය ප්‍රමාණය මෙසේය.

| බැංකුවේ නම | ණය මුදලෙහි සාමාන්‍ය ප්‍රමාණය (රුපියල්) |
|---|---|
| මාතර ප්‍රා. ග්‍රා. සං. බැ. .. .. | 1,633 |
| කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං. බැ. .. .. | 9,965 |
| කළුතර ප්‍රා. ග්‍රා. සං. බැ. .. .. | 3,445 |
| අනුරාධපුර ප්‍රා. ග්‍රා. සං. බැ. .. .. | 10,251 |
| සියලු බැංකුවල සාමාන්‍ය ප්‍රමාණය .. .. | 4,391 |

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් ලබා දුන් ණය ප්‍රමාණයන් කුඩා වීමෙන් පෙනී යනුයේ, සුළු ප්‍රාග්ධනයකින් කළ හැකි ඵලදායී නිෂ්පාදන කාර්යයන් ඇරඹීම සඳහා සමාජයේ දුර්වල කොටස්වලට ණය පහසුකම් ලබා දී ඇති බවය. ප්‍රා. ග්‍රා. සං. බැ. විසින් දෙන ලද ණය මුදල් 1,104 ක් අරමුණ අනුව වර්ගකර පහත දැක්වේ.

| අරමුණ | ණය මුදල් සංඛ්‍යාව | ප්‍රමාණය | ප්‍රදානය කරන ලද මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| කෘෂිකර්මය .. | 395 | 20,27,488 | 41.8 |
| පශු සම්පත් .. | 77 | 5,53,750 | 11.4 |
| කුඩා කර්මාන්ත .. | 257 | 9,99,255 | 20.6 |
| වෙළෙඳ ව්‍යාපාර .. | 287 | 7,89,962 | 16.3 |
| වෙනත් .. | 88 | 4,77,809 | 9.9 |
| එකතුව .. | 1,104 | 48,48,264 | 100.0 |

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, ඔවුන්ගේ පරමාර්ථයන්ට අනුකූලව සිය කටයුතු මෙහෙයවීමේදී, නව පන්නයේ බැංකු ක්‍රම සමහරක් අනුගමනය කර ඇත. සෑම ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛාවක්ම, තැන්පතු එක් රැස් කිරීමේ ව්‍යාපාරයෙහි එක් පියවරක් වශයෙන්, තම බල ප්‍රදේශයට අයත් ගම් වලදී රැස්වීම් (ජනහමුව) සංවිධානය කරනු ලැබේ. මෙහිදී, ශාඛා කළමනාකරු සහ එක් ක්ෂේත්‍ර නිලධාරියකු විසින් ප්‍රා. ග්‍රා. සං. බැංකුවේ පරමාර්ථ සහ ගැමි ආර්ථිකය නඟාසිටුවීම උදෙසා සිය කාර්ය භාරය විස්තර කරනු ලබයි. මෙම රැස්වීම් වලදීම තැන්පතු එකතු කරනු ලබන අතර, පසුව, තැන්පත්කරන්නන්ගේ නිවෙස්වලදී පාස් පොත් භාර දීමට කටයුතුද සැලසේ. තවද, සුළු ණය සම්බන්ධයෙන් ඇපකර නොමැතිව ණය මුදල් ප්‍රදනය කරනු ලබයි.

## ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

1985 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් පුහුණු පාඨමාලා 30 ක් පවත්වන ලදී. මහ බැංකුව, වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, වෙනත් මූල්‍ය ආයතන සහ ග්‍රාමීය සංවර්ධනයට සම්බන්ධිත සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා යෞවන කටයුතු හා රැකි රක්ෂා අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතන කිහිපයක කළමණාකාර නිලධාරීන්ගෙන් තෝරාගත් 580 දෙනෙකු විසින් මෙම පුහුණු පාඨමාලා හදාරන ලදී. විද්‍යාලය මගින් දෙන ලද පුහුණුවේදී, ග්‍රාමීය බැංකු කටයුතු සහ ග්‍රාමීය සංවර්ධනය, ආයෝජන තක්සේරුව, කළමණාකරන සංවර්ධනය, සංඛ්‍යාන, වාණිජ බැංකු කටයුතු සහ ජාත්‍යන්තර බැංකු කටයුතු ආදිය අවධාරණයට ලක්විය.

විද්‍යාලය මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා බැංකු කටයුතු අංශයේ කාර්යක්ෂමතාවය දියුණු කිරීමේ අභිප්‍රායෙන් සිදු කරන ලදී. ග්‍රාමීය අංශයේ පවතින ආර්ථික ප්‍රශ්න තේරුම් ගැනීමේ අවශ්‍යතාවය සහභාගිවන්නවුන් තුළ ජනිත කිරීම සහ එම ප්‍රශ්න විසඳීමට ගන්නා උත්සාහයේදී ඔවුනට උපකාරී වීම මෙම පාඨමාලාවලින් අදහස් කරන ලදී.

1985 සැප්තැම්බර් මාසයේදී, විද්‍යාලයට වර්ෂ හතරක් සම්පූර්ණ විය. 'බැංකු සහ කෘෂිකාර්මික ණය-ඉන්දීය අත්දැකීම්' යන මාතෘකාව යටතේ ඉන්දියානු රිසව් බැංකුවේ හිටපු අධිපති, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හිටපු විධායක අධ්‍යක්ෂ එම්. නරසිම්හම් මහතා විසින් විද්‍යාලයේ සිව්වැනි සංවත්සරික දේශනය පවත්වන ලදී.

## සේවක අර්ථසාධක අරමුදල්

සේවක අර්ථ සාධක අරමුදල් දායක දීමනා, අධිභාර මුදල් හා අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ආදයම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේවා හා කේවළ සාමාජික ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම සහ සේ. අ. අ. පනතේ විධිවිධානයන් ප්‍රකාර, ප්‍රතිලාභ මුදල් සාමාජිකයන් වෙත ගෙවීමේ වගකීම ද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරණු ලබයි. මෙම කටයුතු බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන අතර, කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමග ද කිට්ටු සහයෝගීතාවයකින් ක්‍රියා කරනු ලැබේ. පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි. 1985 වර්ෂය තුළ එහි මෙහෙයවුම් කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දක්වා ඇත.

### දායක මුදල්

1985 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දායක දීමනා ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,920.6 ක් වූ අතර, 1984 වර්ෂයේ එය, රුපියල් දශලක්ෂ 1,583.4 ක් විය. මෙය, ඉකුත් වසර තුළ ලැබුණු දායක දීමනා මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 337.2 ක නැතහොත් සියයට 21.3 ක වැඩිවීමකි.

**සාමාජිකයින්ගේ ශේෂ**

සමාලෝචනයට අදාළ වර්ෂයට පොළී වෙන් කිරීමට පෙර, 1985 දෙසැම්බර් 31 දිනට සාමාජිකයින්ගේ ශේෂයන් රුපියල් දශ ලක්ෂ 13,086.7 ක්ව පැවැති අතර, එය 1984 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 2,693.9 ක නැතහොත් සියයට 25.9 ක වැඩිවීමකි.

**ආයෝජන**

අරමුදල විසින් සමාලෝචන වර්ෂය තුළදී රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් සහ නාගරික සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ණයකරවල රුපියල් දශ ලක්ෂ 5,401.9 ක මුදලක් ආයෝජනය කරන ලද අතර, එය 1984 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 5,895.6 ක් විය. මෙය, 1984 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 493.7 ක අඩුවීමකි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කරනු ලැබූ මුළු ආයෝජන ප්‍රමාණයට, කලින් කරනු ලැබූ ආයෝජන හා භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරුණු ප්‍රේෂණ ඵලයන් නියෝජනය කෙරෙන රුපියල් දශ ලක්ෂ 2,484.5 ක මුදලක් ද ඇතුළත් විය. රජයේ සුරැකුම්පත් වල පමණක් ආයෝජනය කරනු ලැබූ මුදල රුපියල් දශ ලක්ෂ 4,417.8 ක් විය. මෙය, ශ්‍රී ලංකාණ්ඩුව විසින් 1985 වර්ෂය තුළදී නිකුත් කරනු ලැබූ මුළු සුරැකුම්පත් ප්‍රමාණයෙන් සියයට 41.9 ක මුදලක් නියෝජනය කෙරේ. වරින්වර කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්වල වර්ෂය තුළදී ආයෝජනය කරනු ලැබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 816.0 ක් විය. වර්ෂය තුළදී වට්ටම් කරනු ලැබීම නිසා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේ දී, කිසිදු භාණ්ඩාගාර බිල්පතක් අරමුදල සතුව නොතිබිණ. 1985 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් කර තිබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 14,052.0 කි. මෙය, 1984 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 2,917.3 ක වැඩිවීමකි.

**ආයෝජනයන්ගෙන් ලැබූ ආදයම**

1985 වර්ෂයේදී අරමුදල සතු ආයෝජනයන්ගෙන් ලැබූ ආදයම රුපියල් දශ ලක්ෂ 1,552.4 ක් විය. 1984 වර්ෂයේ, එය රුපියල් දශ ලක්ෂ 1,193.9 ක් විය. මෙයින්, රුපියල් දශ ලක්ෂ 358.5 ක නැතහොත් සියයට 30.0 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. අරමුදල වෙත ලැබුණු දයක මුදල් ප්‍රමාණයේ වැඩිවීම නිසා කරනු ලැබූ ආයෝජන සහ කලින් ආයෝජන වලින් ලැබුණු ආදයම, සමාලෝචන වර්ෂය තුළදී ප්‍රති ආයෝජනය කිරීම ද මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**ප්‍රතිලාභ ගෙවීම**

1985 වර්ෂය තුළදී සාමාජිකයින් වෙත, සේ. අ. අ. ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලද මුදල රුපියල් දශ ලක්ෂ 523.6 ක් වූ අතර, 1984 වර්ෂයේ, එය රුපියල් දශ ලක්ෂ 551.6 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 28.0 ක නැතහොත් සියයට 5.0 ක අඩුවීමක් පෙන්නුම් කරයි. සමාලෝචන වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ලැබුණු හිමිකම්පෑම් සංඛ්‍යාව 51,978 ක් විය. මෙයට, ඉන්දියානු සම්භවය ඇති පෙරළා සිය රට යන්නවුන්ගෙන් 3,857 ක් සහ වෛද්‍ය හේතු මත කරනු ලැබූ හිමිකම්පෑම් 20,981 ක් ඇතුළත් විය. වර්ෂය තුළදී ගෙවනු ලැබූ හිමිකම්පෑම් සංඛ්‍යාව 46,123 ක් විය. වෛද්‍ය හේතූන් මත ගෙවනු ලැබූ මෙන්ම, ගෙවීම් සඳහා ලද හිමිකම්පෑම් සංඛ්‍යාව සැහෙන ප්‍රමාණයකින් අඩුවී ඇත.

**සාමාජිකයින්ගේ ශේෂයන් මත පොළිය**

සේවක අර්ථසාධක අරමුදල විසින් සෑම වර්ෂයකම අවසානයේ ඇති සාමාජික ශේෂයන් මත, අරමුදලේ මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදයමෙන් පොළී ගෙවිය යුතු වේ. 1984 වර්ෂය අවසානයට සාමාජිකයන්ගේ ශේෂයන් මත ගෙවිය යුතු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 12.5 දක්වා වැඩි කෙරිණ. වර්ෂය අවසානයේ සාමාජිකයින්ගේ බැරට ඇති ශේෂයන් මත පොළිය ගෙවනු ලබන අතර, ඊට පසුව එක්වන මුදලට ද පොළිය රාශිකෘත වේ. අනතුරුව, වර්ෂය අවසානයේ සාමාජිකයාගේ බැරට පවතින ශේෂය මත මුළු අවුරුද්දටම පොළී ගෙවන

අතර, එම ශේෂයෙන් වර්තන වර්ෂයේ දයක දීමනා නියෝජනය කෙරෙන කිසියම් කොටසක් සාමාජිකයාගේ බැරට ලැබුණු දිනය සැළකිල්ලට නොගැනේ. උදහරණයක් වශයෙන් ජනවාරි මාසයේ ලැබුණු දයක දීමනාවලට ගෙවනු ලබන පරිදිම එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ලැබෙන දයක මුදල් වෙනුවෙන් ද, සම්පූර්ණ වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එබැවින් ක්‍රියාත්මක වන පොළී අනුපාතිකය එක්තරා ඉහළ මට්ටමක පවතී.

අරමුදලේ මෙහෙයවුම් කටයුතු පිළිබඳව දනට ඇති දත්තයන් මත සැකසුණු සංසන්දනාත්මක ප්‍රකාශයක් 2.10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 10 සංඛ්‍යා සටහන**

**සේ. අ. අ. සංඛ්‍යාන 1984 – 1985**

| ශීර්ෂය | 1984 | 1985 |
|---|---|---|
| 1. ලැබූ දයක දීමනා (රු. දශ ලක්ෂ) .. .. | 1,583·4(අ) | 1,920·7(අ) |
| 2. ආයෝජන (රු. දශ ලක්ෂ) .. .. | 5,895·6(ආ) | 5,401·9(ආ) |
| 3. ආයෝජන වලින් ලද ආදයම (රු. දශ ලක්ෂ) .. .. | 1,193·9 | 1,552·4 |
| 4. ප්‍රතිලාභ ගෙවීම් (රු. දශ ලක්ෂ) .. .. | 551·7 | 523·6 |
| 5. ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව .. .. | 65,198 | 46,123 |
| 6. පොළී අනුපාතිකය (සියයට) .. .. | 12·5 | 12·5 |
| 7. සාමාජික ශේෂයන් මත පොළී ප්‍රතිපාදින .. .. | 1,299·1 | 1,635·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අවිනිශ්චිත ගිණුමට බැර කරන ලද දයක දීමනා හැර.

(ආ) රජයේ සුරැකුම්පත්වල ප්‍රති ආයෝජනය කරන ලද කල් පිරුණු ප්‍රේෂණවල සහ කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනද ඇතුළුව.

## විනිමය පාලන

විනිමය පාලනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහ බැංකුව තවදුරටත් රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරන්නට යෙදුණි. විමර්ශනයට අදළ වර්ෂය තුළදී, විනිමය පාලන ක්‍රියා පිළිවෙත්වල සිදුවූ ප්‍රධාන වෙනස්කම් මෙසේය.

1. ආනයන

(i) කුමන හෝ ප්‍රභවයක් වෙතින් ගම්මිරිස්, කරදමුංගු සහ කජු ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමට පෙරාතුව, වාණිජ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය, බලයලත් වෙළෙඳුන් වෙත පනවන ලදී. (85.01.29 වැනි දින හා අංක ඊසී/06/85(බී) සහ 85.04.16 වැනි දින හා අංක ඊසී/20/85(බී) දරන මෙහෙයුම් උපදෙස්)

(ii) කෝපි ආනයනය කිරීම සම්බන්ධයෙන්, 1984 වර්ෂයේදී පනවා තිබුන තහනම, 1985 අප්‍රේල් මාසයේදී ඉවත් කරන ලදී. එසේ වුවද, කෝපි ආනයනය වාණිජ අධ්‍යක්ෂ විසින් පනවනු ලබන කොන්දේසි සමහරකට යටත් කරන ලදී. (85.04.17 වැනි දින හා අංක ඊසී/21/85(එච්) දරණ මෙහෙයුම් උපදෙස්)

(iii) පත්‍ර කඩදසි හා පැරණි පුවත්පත් ආනයනය කිරීම සඳහා ආනයන සහ අපනයන පාලකගෙන් බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ප්‍රකාශයට පත් කරන ලදී. (85.07.10 වැනි දින හා අංක ඊසී/31/85 (බී) සහ 85.10.11 වැනි දින හා අංක ඊසී/51/85 (බී) දරණ මෙහෙයුම් උපදෙස්)

2. අපනයන

(i) ඩී/පී කොන්දේසි පිට ගෙවීම, දින 180 නොඉක්මවන ඩී/ඒ කොන්දේසිවලට වෙනස් කිරීමට අපනයනකරුවන් ඉල්ලා සිටි විට, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විමසීමකින් තොරව, බලයලත් වෙළෙඳුන්ටම සිදු කිරීමට අවසර දෙන ලදී. එහෙත්, එසේ කළහැකි වනුයේ, සාධාරණ හේතු ඉදිරිපත් කරමින් විදෙස් ගැණුම්කරුවන්/ නියෝජිතවරුන් විසින් එවැනි ඉල්ලීම් සඳහා පුරෝගාමී වූ විට පමණි. (85.07.16 වැනි දින හා අංක ඊසී/35/85 (එච්) දරණ මෙහෙයුම් උපදෙස්)

(ii) ඩී/ඒ කොන්දේසි කාලසීමාව දීර්ඝ කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විමසීමකින් තොරව, බලය ලත් වෙළෙඳුන්ටම සිදු කිරීමට බලය දෙන ලදී. එහෙත්, එය දින 180 ක උපරිමයකට යටත් වන අතර, අපනයනකරුවන් විසින් සාධාරණ හේතූන් ඉදිරිපත් කරනු ලැබිය යුතුද වනු ඇත.

(iii) අපනයනකරු විසින් සාධාරණ හේතු ඉදිරිපත් කර ඇත්තේ නම් පමණක්, දින 180 ක උපරිමයක් දක්වා ප්‍රතිග්‍රහණය පිට ලියකියවිලි නියමයනට අදළ කාලච්ඡේදය දීර්ඝ කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් විමසීමක් නොකර බලයලත් වෙළෙඳුන්හට අවසර දෙන ලදී.

(iv) එතෙර ණය දීමේ කටයුතු මෙහෙයවන බැංකුවේ නමට හෝ ණයවර ලිපියෙහි සඳහන් වෙනත් බැංකුවක නමට අණට යටත්වන පරිදි හෝ නොහාර පත්‍රය නිකුත් කළයුතු බවට කොන්දේසියක් ණයවර ලිපියෙහි සඳහන් අවස්ථාවන්හිදී විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් විමසීමක් නොකර ලියකියවිලි පිළිබඳව ගණුදෙනු කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර දෙන ලදී. (85.08.06 වැනි දින හා අංක ඊසී/40/85(එච්) දරන මෙහෙයුම් උපදෙස්)

3. ලාභ සහ ලාභාංශ ප්‍රේෂණය

(i) විදේශ බැංකුවල ශාඛාවන්, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු පවත්වාගන යන හවුල් ව්‍යාපාරයන්හි අනේවාසික කොටස්කරුවන් හා රුපියල් සමාගම්වල අනේවාසික කොටස්කරුවන්ද ඇතුළුව, විදේශ සමාගම්වල ශාඛාවන් විසින් උපයන ලද ලාභ සහ ලාභාංශ එතෙර ප්‍රේෂණය කිරීමේදී, එකී නියමිත ප්‍රමාණය ඉක්මවා යාම වළක්වාලනු අටියෙන්, එවැනි ප්‍රේෂණ සඳහා අනුමැතිය දීමට පෙරාතුව, ආදායම් බදුවලින් නිදහස් කිරීම් සහතිකයක් ඉදිරිපත් කරන ලෙස අවධාරණයෙන් ඉල්ලා සිටින ලෙස බලයලත් වෙළෙඳුන්හට නියම කරන ලදී. (85.05.16 වැනි දින හා අංක ඊසී/25/85 (සී සහ එෆ්) දරන මෙහෙයුම් උපදෙස්)

4. රාජ්‍ය සහ පෞද්ගලික අංශ මගින් ලබා ගන්නා සැපයුම්කරුවන්ගේ ණය හා එතෙර ණය ගැනීම්

(i) විදේශ ණය ගැනීම්වලට (විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලින් ලබාගන්නා ණයද ඇතුළුව) අදළ මූලධන ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් සඳහා ඉදිරිපත් කෙරෙන විදේශ විනිමය අයදුම්පත් සියල්ලම, පූර්ව අනුමැතිය සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස, බලයලත් වෙළෙඳුන් හට උපදෙස් දෙන ලදී. මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායයන් සම්බන්ධයෙන් එසේ අවශ්‍ය නොවේ. එවැනි ණයගැනීම් පිළිබඳව වඩාත් දැඩි පාලනයක් පවත්වා ගන යාමේ අරමුණ ඇතිව, දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන පෝර්ම කට්ටලයක් මාර්ගයෙන්, සවිස්තරාත්මක සංඛ්‍යා තොරතුරු සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. (85.03.22 වැනි දින හා අංක ඊසී/15/85 (සී සහ එෆ්) දරන මෙහෙයුම් උපදෙස්)

**5. ආවෘත අරමුදල්**

(i) අනේවාසික ආවෘත ගිණුම්වලින් ප්‍රේෂණ කළ හැකි උපරිම සීමාව එක් ගිණුම් හිමියකු වෙනුවෙන් රුපියල් 2,00,000 ක් වේ. මෙම සීමාව එසේ පැවතිය ද වාණිජ බැංකු වෙතැති අනේවාසික ආවෘත ගිණුම්වල ඇති සියළුම මුදල් ද, ශ්‍රී ලංකාවෙන් විගමනය වී ගොස් අනතුරුව විදේශීය පුරවැසි බව ලබාගත්තවුන් හැර අනෙකුත් අනේවාසික විදේශකයන් සතුවූ ව්‍යාපාර කොටස් විකිණීමෙන් ලත් මුදල් ද, ප්‍රේෂණය කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත අයදුම් කළහැකි බවට බලයලත් වෙළෙඳුන් වෙත දන්වා සිටින ලදී. (85.04.02 වැනි දින හා අංක ඊසී/18/85 (සී සහ එෆ්) දරන මෙහෙයුම් උපදෙස්)

**6. එතෙර වරායයන්හිදී රැස්කර ගන්නා ලද ගැල් කුලී සහ නැව් ගමන් වියදම් දේශීය නියෝජිතයින් විසින් විදේශයන්හිදී සුදුස්සක් කිරීම**

(i) සිය නියෝජිතයින් විසින් එතෙර වරායයන්හිදී, ස්වකීය නැව් සඳහා කරන ලද සේවාවන්ට අදාළ අයකර ගැනීම් ගෙවීමෙන් පසුව, දේශීය නැව් හිමිකරුවන් හා නැව් කුලියට ලබාගන්නවුන්, විදේශයන්හි රඳවා ගෙනැති ගැල් කුලී සහ නැව් ගමන් කුලී රැස් කිරීම්, වාණිජ බැංකු වෙතැති ඔවුන්ගේ නාවික බාහිර ගිණුම්වල බැර පිණිස, ශ්‍රී ලංකාව වෙත ආපසු ගෙන්වා ගතයුතු බව දැනුම් දෙන ලදී. විනිමය පාලන අනුමැතිය නොලබා, එවැනි මුදල් එතෙර එක් නියෝජිතයෙකු වෙතින් වෙනත් නියෝජිතයෙකු වෙත පැවරීම හෝ වෙනත් කාර්යයක් සඳහා පැවරීම හෝ නීති විරෝධී බව දක්වෙන උපදෙස් නිකුත් කරන්නට යෙදිණ. (85.06.05 වැනි දින හා අංක ඊසී/එස්ජ්/01/85 දරන මෙහෙයුම් උපදෙස්)

**රාජ්‍ය ණය**

මුදල් නීති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර, රජය වෙනුවෙන් රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යනු ලැබීය. රජයේ සුරකුම්පත් / ණය නිකුත් කොට පවත්වා ගෙන යාම, භාණ්ඩාගාර බිල්පත් හා බදු සංචිත සහතික නිකුත් කිරීම, විදේශ ණය පිළිබඳව වාර්තා පවත්වා ගෙනයාම සහ දේශීය හා විදේශීය ණය සේවාකරණය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1985 වසරේදී ඉටු කළ ප්‍රධාන කාර්යයන් විය.

1985 අවසානයට නොපියවා තිබූ දළ හා ශුද්ධ රාජ්‍ය ණය ප්‍රමාණ පිළිවෙලින් දශ ලක්ෂ 1,30,869.9 ක් හා රුපියල් දශ ලක්ෂ 1,23,719.6 ක් විය. 1985 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 10,550.3 ක රුපියල් ණය නිකුත් කරන ලද අතර, වසර අවසානය වනවිට බේරීමට තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 36,570.2 ක් විය. 1985 වසර තුළදී, භාණ්ඩාගාර බිල්පත් සඳහා බලය ලත් සීමාව රුපියල් දශ ලක්ෂ 23,000 සිට රුපියල් දශ ලක්ෂ 25,000 දක්වා රුපියල් දශ ලක්ෂ 2,000 කින් වැඩි කරන ලදී. වසර අවසානය වනවිට නොපියවා ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 22,280 ක් විය. රාජ්‍ය ණය වෙනුවෙන් 1985 දී රුපියල් දශ ලක්ෂ 8,334.7 ක පොළිය ගෙවන ලදී. මෙම ප්‍රමාණයට රුපියල් දශ ලක්ෂ 17.2 ක ණය නිකුත් කිරීමේ වියදම් හා කළමනාකරණ ගාස්තු ද ඇතුළත් විය. වසර තුළදී ලබාගත් මැදි හා දිගු කාලීන විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,032.4 ක් වූ අතර ව්‍යාපෘති, ද්‍රව්‍යාධාර හා වෙනත් විදේශ ණය යටතේ සිදු කළ මුළු විදේශීය ණය ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,788.9 ක් විය. 1985 අවසානය වනවිට ගෙවීමට ඉතිරිව තිබූ මුළු රාජ්‍ය විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 67,673.3 ක් විය.

නාගරික සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ණයකර නිකුත් කිරීම හා සේවා කරණයද මෙම දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. ආර්ථිකයේ අතිරික්ත ද්‍රවශීලතාවය අඩු කිරීම සඳහා මුදල් නීති පණතේ 91(1) (ආ) වගන්තිය යටතේ මහ බැංකු සුරකුම්පත් නිකුත් කිරීම 1985 වසර තුළදී ද මෙම දෙපාර්තමේන්තුව විසින් කරන ලදී.

ශ්‍රී ලංකාවේ විදේශීය ණය දත්තයන් පරිගණක යන්ත්‍ර ගත කළ යුතුයැයි පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහයෝගතා කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව, විදේශීය ණය ලේඛනයක් සැකසීමේ කටයුතුවල මෙම දෙපාර්තමේන්තුව නිරත විය. විදේශීය ණය දත්තයන් පරිගණක යන්ත්‍ර ගත කිරීමට හැකිවනු පිණිස එම දත්තයන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශීය ණය මෙහෙයවුම් ඒකකය වෙත ප්‍රේෂණය කරන ලදී. 1986 වර්ෂයේ මැද භාගයේ දී පමණ නව ක්‍රමය ක්‍රියාත්මක කළ හැකි වේයැයි බලාපොරොත්තු වනු ලැබේ.

## ප්‍රාදේශීය කාර්යාලය—මාතර

1985 වර්ෂය තුළ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයට ස්වකීය කටයුතු තවදුරටත් පුළුල් කිරීමට හැකිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ආර්ථික අංශ දියුණු කිරීම සඳහා හඳුන්වා දෙනු ලැබූ නොයෙකුත් ග්‍රාමීය ණය ක්‍රම යටතේ විශාල පිරිසකට පහසුකම් ලබා දීමට අවස්ථාව සැලසිණි. ගොවීන්, ශිල්පීන් හා ගෘහ කර්මාන්තකරුවන් ආදී කොටස් තුළ තම ආදායම වැඩි කර ගැනීම සඳහා ආයෝජන වැඩි කරනු වස් අවශ්‍ය බැංකු ණය සඳහා ඉල්ලුම විශාල වූ අතර, පාසැල් හැර යන්නන් වැඩි වැඩියෙන් නව ආදායම් මාර්ග වශයෙන් විවිධ ස්වයං රැකියා කටයුතු ආරම්භ කිරීම සඳහා බැංකු ණය ක්‍රම සමහ සම්බන්ධවීමට වැඩි කැමැත්තක් පෙන්නුම් කළහ. ග්‍රාමීය අංශවල නිෂ්පාදනය, ආදායම් හා රැකී රක්ෂා වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති වැඩ පිළිවෙලක් වන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, පෙර මෙන් මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධානතම කටයුත්ත විය. 1985 අවසන් වන විට මෙම කාර්යාලයේ මැදිහත්වීම නිසා 2,728 දෙනෙකුට බැංකු ක්‍රමයෙන් ආධාර ලබා ගැනීමට හැකි වූ අතර, ආදායම් උත්පාදක ව්‍යාපෘතීන් සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 14.1 ක් විය.

ප්‍රාදේශීය කාර්යාලයට පස් වසරක් පිරෙන මේ අවස්ථාවේ වැදගත් අංශයක් වශයෙන් ගිණිය හැක්කේ එහි බල ප්‍රදේශයේ වර්ධනයයි. ප්‍රදේශය තුළ විශාල පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් බාහිර පහසුකම් දියුණුවීම නිසා, 1983 පමණ සිට ආසන්න දිස්ත්‍රික්කවල විවිධ කොටස්වලින් ණය පහසුකම් සඳහා ගලා ආ ඉල්ලුම වේගයෙන් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1985 දී ප්‍රාදේශීය කාර්යාලයේ බලපෑම ගාල්ල, හම්බන්තොට, මොණරාගල යන දිස්ත්‍රික්කවලටද පැතිරෙන්නට විය. මෙම ප්‍රදේශවල තෝරාගත් අංශ කිහිපයක් සඳහා බැංකු ණය ලබා දීමට මෙන්ම ඉකුත් වර්ෂවලදී මෙන් බැංකු හා ගණුදෙනුකරු අතර සමීප සම්බන්ධයක් ගොඩ නැංවීමටද ප්‍රයත්නයන් දරන ලදී. මේ සඳහා කලින් වර්ෂවලදී මෙන් පුහුණු කිරීමේ හා හැඩගැස්වීමේ වැඩ සටහනක් දියත් කරනු ලැබීය. 1985 දී එබඳු සැසි 40 කට 900 ක් පමණ දෙනා සහභාගි වූහ. ඇතැම් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අපහසු හා දුර්වල ඒවා බව මෙම සැසිවලදී හෙළිවිය. ණය ගන්නන් හා දෙන්නන් අතර අත්දැකීම් හුවමාරුවට අවස්ථාවක් හා ණය ක්‍රියාදමයට සම්බන්ධිත වැදගත් අංශවලට එකම තැනකදී මුණගැසීමේ අවස්ථාවද මෙමගින් සැළසිණි. මෙහිදී කාර්මික සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂි සංවර්ධන අධිකාරිය, කෘෂි රක්ෂණ මණ්ඩලය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා වෙනත් එබඳු ආයතන රාශියක්ම ප්‍රාදේශීය කාර්යාලයට සහයෝගය ලබා දුන්හ. එසේම, වසර මුළුල්ලේම එබඳු ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ යෝජනා ක්‍රම සඳහා ද ප්‍රාදේශීය කාර්යාලයේ සහයෝගය ප්‍රාදේශීය කළමනාකරු හා කාර්ය මණ්ඩලය වෙත ලැබිණි. එකී සංවිධාන මගින් සැකසුණු සමුළු 50 කට පමණ ප්‍රාදේශීය කළමනාකරු සහ කාර්ය මණ්ඩලය සහභාගි වූ අතර ප්‍රාදේශීය හා මධ්‍යගත මට්ටමින් ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කමිටුවලට ද ප්‍රාදේශීය කාර්යාලයේ සේවාව තවදුරටත් සලසන ලදී.

මාතර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව පිහිටුවීම හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ග්‍රාමීය ණය ව්‍යාපෘතියක් ඇරඹීම, මෙම වර්ෂය තුළ දී සිදුවූ වැදගත් සිදුවීම් දෙකකි. කාර්ය මණ්ඩල පුහුණුව, ආර්ථික සමීක්ෂණ පැවැත්වීම හා සම්බන්ධීකරණ කටයුතු වලදී ප්‍රාදේශීය කාර්යාලය එකී ආයතන වලට සහාය දුනි. දැනට රාජ්‍ය බැංකු දෙකේ හා ඉන්දියානු ඕවර්සීස් බැංකුවේ ශාඛා සමඟ පවත්වා ගෙන යනු ලබන ණය යෝජනා ක්‍රම යථා කාලයේදී මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛාවලට ව්‍යාප්ත කරනු ලැබේ. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ණය යෝජනා ක්‍රමය ගම්මාන කිහිපයකට පමණක් සීමා වන අතර, එය මහ බැංකු ප්‍රතිමූල්‍ය ණය ක්‍රමවලට පිටස්තරව ක්‍රියාත්මක වනු ඇත.

### ප්‍රතිමූල්‍ය ණය කටයුතු

1985 අවසානයට ප්‍රතිමූල්‍ය ණය කටයුතු පිළිබඳ සංඛ්‍යාමය සාරාංශයක් පහත අංක 2.11 සංඛ්‍යා සටහනේ දක්වේ.

**2 . 11 සංඛ්‍යා සටහන**

**ප්‍රතිමූල්‍ය ණය කටයුතු – මාතර ප්‍රාදේශීය කාර්යාලය – සංඛ්‍යාමය සාරාංශය (1985 වසර අවසානයට සමුච්චිත වශයෙන්)**

| යෝජනා ක්‍රමය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| 1. ස්වයං රැකියා ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 596 | 54,33,500 |
| 2. ගම් නැගුම සිටුවීමේ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 112 | 5,66,685 |
| 3. සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ආදර්ශ යාය වී වගා ණය .. | 1,243 | 35,00,783 |
| 4. වියළි කලාපීය ගොවි ණය .. | 242 | 9,68,000 |
| 5. තේ පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 196 | 12,32,277 |
| 6. පොල් පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 339 | 24,26,617 |
| එකතුව | 2,728 | 14,127,862 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ මැදිහත්වීම නිසා විවිධ ණය යෝජනා ක්‍රම යටතේ, බැංකු මගින් 2,728 දෙනෙකු සඳහා රුපියල් 14,127,862 ක් වටිනා ණය ලබා දී ඇති බව පෙනී යයි. මීට අමතරව, ප්‍රාදේශීය කාර්යාලයේ මග පෙන්වීම මත බැංකු වලින් වෙනත් සාමාන්‍ය ණය පහසුකම් ලබාගත් අයගේ සංඛ්‍යාව ද අතිවිශාලය.

### ස්වයං රැකියා සහ ගම් නැගුම සිටුවීමේ කටයුතු

උගත් තරුණ කොටස්වල රැකියා විරහිත භාවය ප්‍රබල ප්‍රශ්නයක් වන අතර, මාතර ඉඩම් බෙදී යැමේ රටාව ද වාණිජමය කෘෂිකාර්මික කටයුතු වැනි දේට බාධකව පවතී. ඒ අනුව, ආදායම් මාර්ග වශයෙන් ගෘහ කර්මාන්ත, සත්ව පාලනය හා සේවා අංශවල ස්වයං රැකියා කටයුතු ඉහළ ප්‍රමුඛත්වයක් ගනී. බැංකු ක්‍රමය වෙතින් ක්‍රමවත්ව අධීක්ෂණය කරනු ලැබූ ණය පහසුකම් ලබාදී තරුණ කොටස් අතර ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහිදී ප්‍රාදේශීය කාර්යාලය විසින් ව්‍යාපෘති හඳුනා ගනු ලැබීම හා අධීක්ෂණය කරනු ලබන අතර, ඒ සඳහා වාණිජ බැංකු වෙතින් සහන කොන්දේසි යටතේ ණය ලබාදීම කරනු ලැබේ. 1985 අවසාන වනවිට එබඳු ව්‍යාපෘති 690 ක් (ණය ගන්නන් 708 දෙනෙක්) සඳහා රුපියල් දශ ලක්ෂ 6.0 ක පමණ බැංකු ණය සපයා තිබුණි.

ගම් නැගුම සිටුවීමේ යෝජනා ක්‍රමය, ගැමි ආර්ථිකය කෙරෙහි වඩා ප්‍රබල බලපෑමක් ඇති කරවන සේ ගමක් තුළ එකවර ණය ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරවීම අරමුණුකොට ගත්තකි. ඉන්දියානු ඕවර්සීස් බැංකුවේ මාතර ශාඛාව මෙම යෝජනා ක්‍රමයට සහභාගී වී

ගම්මාන කිහිපයක කුඩා ව්‍යාපෘති 83 ක් සඳහා ණය පහසුකම් ලබා දී ඇත. බැංකු මගින් දී ඇති මේ වර්ගවල ණය පහසුකම් ආර්ථික අංශ අනුව වර්ගීකරණයක් 2.12 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**2 .12 සංඛ්‍යා සටහන**

**ස්වයං රැකියා හා ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රම යටතේ මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘති වර්ගීකරණය—මාතර (1985 අවසානයට)**

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| කෘෂිකර්මය .. .. .. | 203 | 12,41,135 |
| කර්මාන්ත .. .. .. | 315 | 15,95,395 |
| සේවා ගොවිපොළවල් ආදිය .. .. .. | 172 | 28,31,025 |
| එකතුව .. .. | 690 | 56,67,555 |

අංක 2.12 සංඛ්‍යා සටහන අනුව, සමස්තයක් වශයෙන් සේවා අංශයට බරව ණය කටයුතු සිදුවී ඇති බව පෙනේ. රෝද දෙකේ ට්‍රැක්ටර් සහ ගොවිපොළ උපකරණ සඳහා දුන් ණය මෙහිලා ප්‍රධාන විය. වැඩිම ඒකක ගණනක් ඇති කර්මාන්ත අංශයේ මුල්තැන ගෙන ඇත්තේ ආහාර, රෙදිපිළි, ගඩොල් සහ සුළු කර්මාන්ත යන ඒකකයන් ය. කෘෂි කර්මාන්ත අංශයේ කුකුල් පාලන ඒකකවලට මුල්තැන ලැබිණි. ණය යෝජනා ක්‍රම වල විස්තරාත්මක කැඩී සටහනක් අංක 2.13 හා 2.14 දරන සංඛ්‍යා සටහන්වල දැක්වේ. අංක 2.13 දරන සංඛ්‍යා සටහනේ අඩංගු වනුයේ, 1985 වර්ෂය අවසානයේදී ප්‍රාදේශීය කාර්යාලය මගින් හඳුනාගනු ලැබ නිර්දේශිත ණය ව්‍යාපෘති පිළිබඳ විස්තර අතහැර දමනු ලබන ව්‍යාපෘති යෝජනාවලට අනුව වරින් වර ගැලපීම් කරන ලද සංඛ්‍යානයන්ය. නොයෙකුත් දුෂ්කරතා හේතුකොටගෙන විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් ණය ලබාගත නොහැකිවී කල්ගතව අත්හැර දමනු ලබන බව මෙහිලා සඳහන් කළ යුතුය. ඇතැම්විට බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසි ඉටු කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වන අතර, ණය අනුමත කරන මෙන් බැංකුවලට බල කිරීමට ප්‍රාදේශීය කාර්යාලයටද නො හැකිය. ණය ලබාදීමේ වැඩ පිළිවෙලවල් වැඩි දියුණු කොට, මීමගින් ගැමි ආර්ථිකය නගා සිටුවීම සඳහා, කුඩා පරිමාණයේ ණය ලබා දීමේ විශ්වාසදායක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකු බලධාරීනට ඇති ඉඩ ප්‍රස්ථා බොහෝය.

DISCARDED

**වී වගා ණය**

මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර 45,000 ක් පමණ ඇති අතර, මින් වැඩි කොටස අහස් දියෙන් වගා කෙරේ. මේ නිසා වී වගාවේ අවිනිශ්චිත බව අධික වන අතර, එම අංශයට ණය දීමේදී, අවදානම ද වැඩිය. මෙම ස්වාභාවික තත්ත්වයන් හා කල්පසු වූ වගා ණය පිළිබඳ අමිහිරි අත්දැකීම් ද සැළකිල්ලට ගනිමින් වී වගා අංශයේ සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යළිත් ප්‍රචලිත කිරීම සඳහා නවතම ප්‍රයත්නයක් ප්‍රාදේශීය කාර්යාලය මගින් දරනු ලැබීය. මේ සඳහා 'ආදර්ශ යාය යෝජනා ක්‍රමය' යනුවෙන් නම් කරනු ලබන දැඩි අධීක්ෂණයෙන් යුත් ණය ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ යටතේ කුඹුරු ගොවීන් වඩා සංවිධානාත්මකව යම් මෙහෙයවීමක් යටතේ වගා ණය ලබා ගන්නා අතර, කන්නය තුළදී ඔවුන්ගේ උපකාරය පිණිස නොයෙකුත් අමතර සේවාවන් ද ක්‍රියාත්මක වේ. 1981/82 මහ කන්නයේදී තංගල්ලේ සුළු ගොවි පිරිසකගෙන් ආරම්භ කළ මෙම වගා ණය දීමේ ක්‍රමය ඉක්මණින් මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත විය. දැනට අක්කර 1,200 පමණ කුඹුරු වගා කිරීම සඳහා කන්නයකට රුපියල් දශ ලක්ෂ 1.9 ක පමණ වගා ණය මුද හරිනු ලැබේ. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව ආරම්භ කිරීම නිසා මෙම ණය සීඝ්‍රයෙන් වැඩි වීමට බොහෝදුරට ඉඩකඩ ඇත.

## 2 . 13 සංඛ්‍යා සටහන

### 1985 දෙසැම්බර් මස අවසානයට මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ස්වයං රැකියා සහ ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රම යටතේ ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අංශය | ස්වයං රැකියා යෝජනා ක්‍රමය | | | | ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය | | | | මුළු එකතුව | | | | ගණනය කරන ලද රැකියා ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිර්දේශිත මුළු එකතුව සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | අනුමත මුළු එකතුව සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | නිර්දේශිත මුළු එකතුව සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | අනුමත මුළු එකතුව සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | නිර්දේශිත මුළු එකතුව සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | අනුමත මුළු එකතුව සංඛ්‍යාව | ප්‍රමාණය (රුපියල්) | |
| **කෘෂිකර්මාන්ත** | | | | | | | | | | | | | |
| 1. කෘෂිකර්මාන්තය .. | 40 | 1,11,335 | 26 | 85,885 | 4 | 11,000 | 1 | 2,000 | 44 | 1,22,335 | 27 | 87,885 | 33 |
| 2. කිරිහරකුන් ඇති කිරීම .. | 23 | 1,27,700 | 15 | 85,000 | 7 | 35,200 | 6 | 29,800 | 30 | 1,62,900 | 21 | 1,14,800 | 24 |
| 3. කුකුලන් ඇති කිරීම .. | 140 | 10,60,350 | 83 | 6,41,050 | 49 | 3,34,200 | 48 | 3,23,400 | 189 | 13,94,550 | 131 | 9,64,450 | 133 |
| 4. එළුවන් ඇතිකිරීම .. | 2 | 12,500 | 1 | 5,000 | 18 | 41,000 | 18 | 41,000 | 20 | 53,500 | 19 | 46,000 | 26 |
| 5. ධීවර කර්මාන්තය .. | 12 | 1,81,000 | 5 | 28,000 | — | — | — | — | 12 | 1,81,000 | 5 | 28,000 | 5 |
| **කර්මාන්ත** | | | | | | | | | | | | | |
| 6. බේකරි සහ රස කැවිලි .. | 59 | 3,43,190 | 43 | 2,24,890 | 3 | 11,000 | 3 | 11,000 | 62 | 3,54,190 | 46 | 2,35,890 | 85 |
| 7. අනෙකුත් ආහාර නිෂ්පාදිත .. | 2 | 25,000 | — | — | — | — | — | — | 2 | 25,000 | — | — | — |
| 8. දුම්කොළ/බීඩි .. | 5 | 38,200 | 4 | 30,200 | — | — | — | — | 5 | 38,200 | 4 | 30,200 | 11 |
| 9. අත්යන්ත්‍ර රෙදිපිළි .. | 29 | 1,56,300 | 20 | 1,05,800 | 8 | 37,500 | 7 | 32,500 | 37 | 1,93,800 | 27 | 1,38,300 | 56 |
| 10. ඇඳුම් මැසීම .. | 83 | 5,58,015 | 62 | 3,87,315 | 5 | 30,000 | 5 | 30,000 | 88 | 5,88,015 | 67 | 4,17,315 | 107 |
| 11. අනෙකුත් පේෂකර්ම නිෂ්පාදිත .. | 19 | 1,18,470 | 12 | 60,370 | 1 | 10,000 | 1 | 10,000 | 20 | 1,28,470 | 13 | 70,370 | 31 |
| 12. වඩු වැඩ .. | 26 | 1,57,720 | 22 | 1,32,720 | 2 | 10,500 | 2 | 10,500 | 28 | 1,68,220 | 24 | 1,43,220 | 34 |
| 13. කඩදාසි නිෂ්පාදිත .. | 2 | 9,090 | 2 | 9,090 | — | — | — | — | 2 | 9,090 | 2 | 9,090 | 3 |
| 14. ලෝහ නොවන ඛනිජ .. | 84 | 3,95,675 | 70 | 3,06,825 | 2 | 8,150 | — | — | 86 | 4,03,825 | 70 | 3,06,825 | 174 |
| 15. කළුගල් කැඩීම .. | 7 | 31,500 | 7 | 31,000 | 2 | 5,471 | 2 | 5,250 | 9 | 36,971 | 9 | 36,250 | 21 |
| 16. ලෝහ නිෂ්පාදිත .. | 13 | 96,200 | 9 | 41,200 | — | — | — | — | 13 | 96,200 | 9 | 41,200 | 28 |
| 17. කොහු නිෂ්පාදිත .. | 43 | 1,33,940 | 28 | 79,520 | 12 | 34,210 | 9 | 21,415 | 55 | 1,68,150 | 37 | 1,00,935 | 47 |
| 18. අළුත්වැඩියා සහ නඩත්තු කිරීම .. | 48 | 2,76,945 | 34 | 1,92,695 | 1 | 5,000 | 1 | 5,000 | 49 | 2,81,945 | 35 | 1,97,695 | 51 |
| 19. ගොවි උපකරණ .. | 77 | 23,86,355 | 71 | 22,74,480 | 4 | 14,300 | 4 | 14,300 | 81 | 24,00,655 | 75 | 22,88,780 | 76 |
| 20. රසායනික ද්‍රව්‍ය .. | 6 | 55,800 | 6 | 55,800 | 1 | 10,000 | 1 | 10,000 | 7 | 65,800 | 7 | 65,800 | 7 |
| 21. වෙළෙඳ හා වාණිජ කටයුතු .. | 24 | 1,31,700 | 19 | 94,900 | — | — | — | — | 24 | 1,31,700 | 19 | 94,900 | 21 |
| 22. අනෙකුත් .. | 71 | 4,81,505 | 39 | 2,29,130 | 8 | 40,670 | 4 | 20,520 | 79 | 5,28,175 | 43 | 2,49,650 | 63 |
| එකතුව | 815 | 68,94,490 | 578 | 51,00,870 | 127 | 6,38,201 | 112 | 5,66,685 | 942 | 75,32,691 | 690 | 56,67,555 | 1,036 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**2 . 14 සංඛ්‍යා සටහන**

**1985 දෙසැම්බර් අවසානයට මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ස්වයං රැකියා සහ ගම් නහා සිටුවීමේ යෝජනා ක්‍රමය යටතේ ණය අයකර ගැනීම්**

| අංශය | මුදහළ ණය ප්‍රමාණය (රුපියල්) | මුල් මුදල ආපසු ගෙවීම් | | |
|---|---|---|---|---|
| | | ලැබිය යුතු ප්‍රමාණය (රුපියල්) | ගෙවා නිමි ප්‍රමාණය (රුපියල්) | කල් ඉකුත් වූ ප්‍රමාණය (රුපියල්) |
| **කෘෂිකර්මාන්ත** | | | | |
| 1. කෘෂිකර්මාන්තය .. | 52,050 | 21,140 | 16,671 | 4,469 |
| 2. කිරි හරකුන් ඇති කිරීම .. | 37,800 | 26,000 | 18,600 | 7,400 |
| 3. කුකුළන් ඇති කිරීම .. | 5,23,514 | 2,43,339 | 1,53,347 | 89,992 |
| 4. එළුවන් ඇති කිරීම .. | 35,305 | 12,000 | 9,525 | 2,475 |
| 5. ධීවර කර්මාන්තය .. | 28,000 | 10,098 | 4,459 | 5,639 |
| **කර්මාන්ත** | | | | |
| 6. බේකරි සහ රසකැවිලි .. | 1,47,085 | 60,358 | 39,654 | 20,704 |
| 7. අනෙකුත් ආහාර නිෂ්පාදන .. | — | — | — | — |
| 8. දුම්කොළ/බීඩි .. | 20,800 | 11,360 | 1,536 | 9,824 |
| 9. අත්යන්ත්‍ර රෙදිපිළි .. | 1,05,000 | 35,988 | 25,385 | 10,603 |
| 10. ඇඳුම් මැසීම .. | 2,45,840 | 89,209 | 71,549 | 17,660 |
| 11. අනෙකුත් පේෂකර්ම නිෂ්පාදන .. | 48,300 | 28,200 | 20,227 | 7,973 |
| 12. වඩු වැඩ .. | 63,470 | 30,056 | 18,364 | 11,692 |
| 13. කඩදාසි නිෂ්පාදිත .. | — | — | — | — |
| 14. ලෝහ නොවන ඛනිජ .. | 1,15,335 | 63,194 | 38,642 | 24,552 |
| 15. කළුගල් කැඩීම .. | 22,000 | 16,020 | 13,468 | 2,552 |
| 16. ලෝහ නිෂ්පාදිත .. | 19,000 | 15,055 | 13,990 | 1,065 |
| 17. කොහු නිෂ්පාදිත .. | 67,500 | 47,220 | 38,035 | 9,185 |
| 18. අලුත්වැඩියා සහ නඩත්තු කිරීම් .. | 1,13,882 | 58,497 | 31,508 | 26,989 |
| 19. ගොවි උපකරණ .. | 21,90,700 | 12,86,770 | 12,20,189 | 66,581 |
| 20. රසායනික ද්‍රව්‍ය .. | 56,000 | 13,433 | 6,532 | 6,901 |
| 21. වෙළෙඳ හා වාණිජ කටයුතු .. | 64,000 | 33,363 | 25,659 | 7,704 |
| 22. අනෙකුත් .. | 1,56,837 | 72,521 | 47,736 | 24,785 |
| එකතුව .. | 41,12,418 | 21,73,821 | 18,15,076 | 3,58,745 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**වියළි කලාපය**

හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල ගොවීහු උස්සාන වාරිමාර්ග පහසුකම්, ගොවිපොළ උපකරණ හා අතුරු භෝග වගා කටයුතු සඳහා ණය පහසුකම් ලබා ගැනීමට දැඩි උද්යෝගයක් දැක්වූහ. ප්‍රථම වතාවට, බැංකු ණය පහසුකම් යටතේ කණින ලද ළිං ජලය හා බැංකු ණය මගින් සැපයූ වතුර පොම්ප යොදා ගනිමින් තම වගාවන් සඳහා ජල සම්පාදනය කොට-ගත් ගොවි කණ්ඩායමක් වැල්ලවාය සහ බුත්තල ප්‍රදේශවල ස්ථාවර වගා ක්‍රමයට අනුව හැඩ ගැසීම 1985 දී සිදු විය. වසර අවසාන වනවිට එබඳු වගා ඒකක 50 ක් පමණ එම ප්‍රදේශයේ ඇතිවිණ. බැංකුවේ මුළු ආයෝජනය ඉක්මවා එක් කන්නයක් තුළ දී ආදයම් ලැබූ ගොවීහුද ඒ අතර වූහ. මෙම ගොවීන් සඳහා එළවළු, ළූණු, මිරිස් ආදී භෝග වගා ණය ද සංවිධානය කරනු ලැබීය.

**තේ හා පොල් පොහොර ණය**

ප්‍රදේශයේ ප්‍රධානතම වැවිලි කර්මාන්ත වනුයේ තේ සහ පොල්ය. එකී වගාවනට යෙදවුම් සැපයීම සඳහා පවතින මෙම ණය ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය කාර්යාලය විසින් ණය ප්‍රදනය කිරීම පහසු කිරීම පිණිස ණය කඳවුරු හා ගොවි කණ්ඩායම් සංවිධානය කිරීම විශේෂ උදව්වක් වූ බව පෙනෙන්නට තිබිණ. තේ පොහොර ණය යෝජනා ක්‍රමය, අභිතකර අන්දමින්

මිළ වෙනස්වන අවස්ථාවක, කුඩා වතු හිමියන්ට මහත් වාසිදයක වූ නමුදු මේ දක්වා ප්‍රතිමූල්‍ය පහසුකම් වැඩි කොටස භාවිතයට ගෙන නැත. ණය දීමේදී අනුගමනය කෙරෙන සංකීර්ණවූත්, හිරිහැරදයකවූත් පිළිවෙත් මෙම ණය කඩිනමින් ප්‍රදනය කිරීමට බාධාවක්ව ඇති බව පෙනී යයි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පොහොර ණය කමිටු රැස්වීම්වලට ප්‍රාදේශීය කාර්යාලයද නිතිපතා සහභාගි වූ අතර, තේ වගා කටයුතු සඳහා සහනාධාර අනුබද්ධිත ණය ක්‍රමයක් දනට යෝජනා කොට ඇත.

### ණය ආපසු ගෙවීම

සුළු පරිමාණ ණය ගෙවීම් පැහැර හැරීම ග්‍රාමීය ණය ක්‍රම පිළිබඳව තදබල විවාදයට ලක් වූ කරුණකි. වාසනාවකට මෙන් ප්‍රාදේශීය කාර්යාලය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමවල ආපසු අය කිරීම් සාපේක්ෂව ඉහළ මට්ටමක වූ බව 2.15 සංඛ්‍යා සටහනින් දක්වේ.

ණය අයකර ගැනීමේ ප්‍රතිශත සම්බන්ධයෙන් වාර්තාගත තත්වයක් තිබියදීත්, ණය අය කිරීම පිළිබඳ කනස්සල්ලට හේතු නැත්තේ නොවේ. ණය පැහැර හරින අයගෙන් ණය අය කිරීම සඳහා නීතිමය කටයුතු කිරීමට ප්‍රමාද වීම, ගණුදෙනු කරුවන් අතර ප්‍රචලිත වැරදි අදහස් හා ආකල්ප සහ සැබෑ දුෂ්කරතාවලට පත් ව්‍යාපෘති කරුවනට උපකාරී වීමට බැංකුවලට නොහැකි වීම ආදිය මින් සමහරකි. රාජ්‍ය බැංකු දෙක මගින් ප්‍රදනය කරන ලද ස්වයං රැකියා ණය මේ නිසා දැඩි පීඩනයකට පත්වූ බව කිව යුතුය. මෙකී ණය පැහැර හැරීම ලංකා බැංකු ණය සම්බන්ධයෙන් සියයට 32 ක් වූ අතර මහජන බැංකුව සම්බන්ධයෙන් සියයට 26 ක් විය.

**2 . 15 සංඛ්‍යා සටහන**

**ණය ආපසු ගෙවීම**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම (1985 අවසානයට)**

| යෝජනා ක්‍රමය | ණය අයකිරීමේ ප්‍රතිශතය |
|---|---|
| ස්වයං රැකියා සහ ගම් නඟාසිටුවීමේ ණය .. .. | 83 |
| වී වගා ණය .. .. | 90 |
| වියලි කලාපීය ගොවි ණය .. .. | 90 |
| තේ පොහොර ණය .. .. | (සහන කාලය) |
| පොල් පොහොර ණය .. .. | (සහන කාලය) |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### ආර්ථික ප්‍රතිඵල

ණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආදයම් ඇතිවීම, රැකියා අවස්ථා බිහිවීම, අගය එකතුව හා නිෂ්පාදන වර්ධනය යන ආර්ථික ප්‍රතිලාභ මැනිය හැකිය. තෝරාගත් ණය ව්‍යාපෘති වර්ග කිහිපයක ප්‍රධාන ආර්ථික ලක්ෂණ 2.16 සංඛ්‍යා සටහනින් විදහා දක්වේ.

## 2 . 16 සංඛ්‍යා සටහන
## ණය ව්‍යාපෘති ආර්ථික ප්‍රතිඵල – ප්‍රාදේශීය කාර්යාලය – මාතර
## (1985 අවසානයට)

| වර්ගය | ව්‍යාපෘති ඒකක සංඛ්‍යාව | මුළු ව්‍යාපෘති පිරිවැය (රු. දශ ලක්ෂ) | බැංකු ණය (රු. දශලක්ෂ) | දළ වාර්ෂික නිෂ්පාදන අගය ඇස්තමේන්තු (රු. දශලක්ෂ) |
|---|---|---|---|---|
| 1. ස්වයං රැකියා ණය | 690 (ඒකක) | 7·2 | 5·6 | 40·0 |
| 2. වී වගා ණය | 1,215 (අක්කර) | 8·5* | 3·5** | 8·7*** |
| 3. වියලි කලාපීය ගොවි ණය | 200 (ගොවීන්) | 0·8 | 0·4 | 2·0† |
| 4. කෘෂි ළිං ව්‍යාපෘති | 43 (ඒකක) | 0·8 | 0·5 | 0·8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

* අක්කරයකට රු. 3,500 බැගින්
** කන්න දෙකට
*** අක්කරයකට බුසල් 55 හා බුසල රු. 65 බැගින්
† අවුරුද්දකට අක්කරයකින් රු. 5,000 බැගින් අක්කර 400

ස්වයං රැකියා ව්‍යාපෘති 690 න් පුද්ගලයන් 1,036 කට පමණ සේවා අවස්ථා සැළසෙතැයි ගණන් බලා ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය. අර්ධකාලීන රැකියා අවස්ථාද ඊට ඇතුළත්ය.

### සංවිධානාත්මක කටයුතු

ණය ව්‍යාපෘතිවල මහජන සහභාගිත්වය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ නිෂ්පාදන හා ගොවි කණ්ඩායම් සංවිධානය කිරීමෙහි ද ප්‍රාදේශීය කාර්යාලය අදාළ වර්ෂය තුළ නිරත විය. වියළි කලාපීය ගොවීන් උනන්දුව දක්වූයේ ගොවි සමිති ක්‍රමයකටය. කුඹුරු ගොවීන් ණය සමිති ක්‍රමයටද, පේෂ කාර්මික, කොහු කර්මාන්ත හා කුකුල් පාලන කටයුතු කරන නිෂ්පාදන කණ්ඩායම් සැපයුම් හා අලෙවි සේවා සමිති පිළිබඳව ද උනන්දුව දක්වූහ. විවිධ රාජ්‍ය නොවන ආයතන ද මෙම කණ්ඩායම්වල නිෂ්පාදනය හා අලෙවිය දියුණු කර ගැනීමට හා වඩා හොඳ මිළක් ලබා ගැනීමට උදව් කළහ. 1985 අවසානයට සාමාජිකයන් 400 කටත් වඩා වැඩි ගණනක් සම්බන්ධ වූ එවැනි කණ්ඩායම් 21 ක් තිබිණ. මෙම කණ්ඩායම්වල ප්‍රයෝජනය පිණිස සාකච්ඡා, තාක්ෂණික සැසි, මෙහෙයුම් හා උපදෙස් සායන, කඳවුරු හා ප්‍රදර්ශණ ආදිය ප්‍රාදේශීය කාර්යාලය විසින් සංවිධානය කරනු ලැබීය.

### වෙනත් කටයුතු

දත්ත රැස්කිරීම් හා සමීක්ෂණ සමුළු පැවැත්වීමේ කටයුතු වලදී ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛණ හා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවලට ප්‍රාදේශීය කාර්යාලය උපකාරී විය. මාතර ප්‍රදේශයේ බැංකු නිලධාරින් අමතා නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය පිළිබඳ මෙහෙයුම් උපදෙස් හඳුන්වාදීම සඳහා ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව සඳහා සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබීය. ජාතික තරුණ සේවා සභාව, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය හා වෙනත් රාජ්‍ය නොවන ආයතන ද විවිධ ව්‍යාපෘති හා වැඩ සටහන් පවත්වාගෙන යාමේදී ප්‍රාදේශීය කාර්යාලීය සහයෝගය ලබාගෙන ඇත.

දිනකට දෙවරක් පැවැත්වෙන ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය 1985 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 891 ක් වටිනා චෙක්පත් 1,38,554 ක් නිෂ්කාශණය කොට ඇත.

## ප්‍රාදේශීය කාර්යාලය—අනුරාධපුරය

1985 වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුර පළමුවැනි අදියරෙහි අංක 340 හා 340 අ දරණ ස්ථානයේ පිහිටි තට්ටු තුනකින් යුත් අභිනවයෙන් තැනූ සිය ගොඩනැගිල්ලට ගෙනයනු ලැබීය.

ආරක්ෂිත හේතූන් නිසා දිස්ත්‍රික්කයේ උතුරු කොටසේ බැංකු කටයුතු වේලාවන් සීමා කිරීමටත්, සිය සේවාවන් අඩුකරලීමටත් ප්‍රදේශයේ බැංකුවලට සිදු විය. තැන්පතු බාර ගැනීම් හා ඒවා ආපසු ලබාදීම් සමහර බැංකු මගින් සුළු මුදල් ප්‍රමාණයනට සීමා කරන ලදී. මහජන බැංකුව විසින් උකස් බඩු නොගැනීම නිසා දිස්ත්‍රික්කයේ ගොවීනට ණය ලබා ගැනීමට තිබූ ඉඩකඩ අඩුවිය.

ඉතාමත් අහිතකර වාතාවරණයක් තිබියදී වුවද, සිය විශේෂ මැදි හා දිගු කාලීන ණය වැඩ පිළිවෙල යටතේ ග්‍රාමීය ණය දීම ප්‍රාදේශීය කාර්යාලය මගින් තව දුරටත් පුළුල් කරන ලදී. වර්ෂය තුළදී සිදුකරන ලද ප්‍රධාන කාර්යය මෙය විය. දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවල ක්ෂේත්‍ර සංචාර අඩුකරලීමට සිදුවූ බැවින්, මෙම වැඩ පිළිවෙල යටතේ පහසුකම් ව්‍යාප්ත කිරීමද එක්තරා ප්‍රමාණයකට සීමා විය. එසේ වුවද, ලබාදෙන ලද ණය පරිමාවෙහි වැඩි වීමක් සිදුවූ අතර, බැංකු මගින් හඳුනාගෙන අනුමත කරන ලද ව්‍යාපෘතීන් වඩාත් විවිධාකාර ස්වභාවයක් ඉසිලීය.

සංවර්ධන ක්‍රමය යටතේ හඳුනා ගනු ලැබූ මැදි හා දිගු කාලීන ව්‍යාපෘතීන් 1,254 ක් වන මුළු සංඛ්‍යාව අතරින් 411 ක් බැංකු විසින් අනුමත කරන ලද අතර, 1985 අවසන් වන විට ඒවායින් ව්‍යාපෘතීන් 357 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණ. සමාලෝචනයට ලක්වී ඇති වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 300 ක් හඳුනා ගනු ලැබූ අතර, ඒවායින් 122 ක් බැංකු විසින් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතීන් සඳහා වාණිජ බැංකුවල සහභාගිත්වය රුපියල් 31,62,410 ක් විය.

**2 . 17 සංඛ්‍යා සටහන**

**හඳුන්වාදී අනුමත කරන ලද ව්‍යාපෘතීන්හි සාරාංශය**

| කාණ්ඩය | හඳුනා ගනු ලැබූ ඒකක ගණන | නිර්දේශිත ණය ප්‍රමාණය රුපියල් | බැංකු විසින් අනුමත කරනලද ඒකක ගණන | බැංකු ණය ප්‍රමාණය රුපියල් |
|---|---|---|---|---|
| කෘෂිකර්මාන්ත .. | 546 | 55,17,700 | 173 | 18,70,200 |
| පශු සම්පත් .. | 483 | 23,95,479 | 127 | 6,06,285 |
| කර්මාන්ත .. | 160 | 13,00,739 | 79 | 5,21,175 |
| සේවා .. | 65 | 3,64,750 | 32 | 1,64,750 |
| එකතුව .. | 1,254 | 95,78,668 | 411 | 31,62,410 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ප්‍රාදේශීය කාර්යාලය මගින් හඳුනා ගනු ලැබූ හා වාණිජ බැංකු විසින් අනුමත කරන ලද ව්‍යාපෘතීන්ගෙන් විශාල සංඛ්‍යාවක් තවදුරටත් කෘෂිකර්මාන්තයට සම්බන්ධ විය. දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය වනුයේද එයමය. භූගත ජලය ප්‍රයෝජනයට ගෙන කරනු ලබන කුඩා පරිමාණ කෘෂිකාර්මික ව්‍යාපෘතීන් දිස්ත්‍රික්කයේ වඩ වඩාත් ජනප්‍රිය වී ඇත.

විශේෂ සංවර්ධන ණය දීමේ වැඩ පිළිවෙල යටතේ දෙනු ලැබූ ණය මුදල්වලින් වැඩි කොටසක් සුළු ගොවීන්ට හා අඩු ආදායම් ලබන කොටස්වලට ලබාදීම උදෙසා උපයෝගී කර ගැනීම සඳහා වගබලා ගැනීමට ප්‍රාදේශීය කාර්යාලය දිරි ගන්නා ලදී. මුල්වරට ගෙවන ප්‍රමාණයන් අඩුකර ලීම, ණය කල්පිරීමේ කාලසීමාවන් දීර්ඝ කිරීම හා අඩු පොළී අනුපාතිකයන් වැනි වාසිදයක කොන්දේසි මගින් එය ඉටු කරන ලදී. තවද, ණය ලබා ගන්නවුන් විසින් මහ බැංකුව මගින් සලසන ලද අභ්‍යාස පහසුකම්, නිරන්තර මගපෙන්වීම හා සහාය බුක්ති විඳින ලදී.

රැකියා සැපයීම හා ආදායම් උපදවීම සම්බන්ධයෙන් සළකන කළ, දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘතීන් ප්‍රසංශනීය ප්‍රගතියක් පෙන්නුම් කරයි. වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 12 ක ආදායම් උපදවීමක් සිදුවූ බව ඇස්තමේන්තු කර ඇත. තවද, රැකියා අවස්ථාවන් 274 ක් (ණය ගන්නවුන් හැර) ඇති කිරීමට වර්ෂය තුළදී හැකිවිය. බොහොමයක් ව්‍යාපෘතීන්වල සහ ආපසු ගෙවීම්වල සාර්ථකත්වයට ඉවහල් වූ සාධකයන් වශයෙන් නිරතුරුව කළ මගපෙන්වීම හා සහායත්, නොකඩවා කෙරුණු ව්‍යාපෘති සේවාවනුත් දැක්විය හැක.

1985 දෙසැම්බර් අගදී ණය ආපසු ගෙවීමට නියමිත ව්‍යාපෘතීන් 240 අතුරින් ව්‍යාපෘතීන් 44 ක්ම සිය ණය මුදල් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන ලදී. ව්‍යාපෘතීන් සමහරක් අසාර්ථකවීමත්, හිතාමතා ණය ආපසු ගෙවීම් පැහැර හැරියවුන් කිහිපදෙනෙකුත් නිසා ආපසු ගෙවීම් අනුපාතය කෙරෙහි බලපෑමක් ඇති විය. එහෙත්, ආපසු ගෙවීම් අනුපාතිකය සියයට 75 කටත් වඩා වැඩි වන හෙයින් කෘෂිකාර්මික ණය ආපසු ගෙවීම් හා සසඳන විට මෙය ඉතා සතුටුදයක තත්වයක් ලෙසින් සැළකිය හැකිය. අසාර්ථක වූ ව්‍යාපෘතීන් සඳහා නැවත ලේඛනගත කිරීමේ ක්‍රම සකස් කොට ඇති අතර, හිතාමතා ණය ආපසු ගෙවීම් පැහැරහරින්නන් පිළිබඳව නිරතුරුව පරීක්ෂාවෙන් සිටිනු ලැබේ.

**පුහුණු කිරීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ හා ගම් මට්ටමේ රැස්වීම්**

ගැමි ජනතාව සමග නිරතුරු සම්බන්ධතාවයක් පවත්වා ගෙනයාම සහ ණය ගන්නා ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ණය දීමේ වැඩපිළිවෙලෙහි අත්‍යාවශ්‍ය අංගයක් වශයෙන් ගැනුණි. සංවර්ධන හැකියාවන් සහ ආයතනික ණය දීම් සම්බන්ධයෙන් ශක්තිමත් වූද, ඵලදයී වූද සංදේශනයක් සඳහා ගම් මට්ටමේ රැස්වීම් (ජන හමුව) සාර්ථක මාධ්‍යයක් විය. වර්ෂය තුළදී එවැනි රැස්වීම් 45 ක් පවත්වා ඇති අතර, 2,000 දෙනෙකු පමණ ඒවාට සහභාගි වූහ. ඉකුත් වර්ෂයේදී මෙන් නොව, ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්කය තුළ ස්ථාන හතක විමධ්‍යගත කොට පවත්වන ලදී. කෘෂිකාර්මික පුහුණුව ලැබුවන්ගේ සංඛ්‍යාව තුන්සිය පණස් හයක් විය. මේ අනුව මෙම පුහුණුවීම් වැඩසටහන් යටතේ ප්‍රයෝජන ලබා ඇත්තවුන්ගේ මුළු සංඛ්‍යාව 2,000 කට ආසන්න වෙයි. මෙකී වැඩසටහන් පංති දේශන හා ක්ෂේත්‍ර සංචාර වලින් සමන්විත විය.

ජනතාව සමග කෙරුණු අදහස් හුවමාරුවට අමතරව, ග්‍රාමීය ණය සැපයීමේ නව ක්ෂේත්‍රයනට අවතීර්ණ වන අන්දමට බැංකු නිලධාරීන් පොළඹවන අයුරින් ඔවුන් සමගද නිරතුරුව සාකච්ඡා පවත්වන ලදී.

---

සංවර්ධනය පෙරදැරි කර ගත් දිගුකාලීන ව්‍යාපෘතීන් හා ආයතනවලින් ණය ලබාගැනීම සම්බන්ධයෙන් ජනතාවගේ ආකල්පය වෙනස් කිරීමේ අදහසින් පුහුණු කිරීමේ වැඩ සටහන් හා ගම් මට්ටමේ රැස්වීම් පැවැත්වුණි.

සිය පුහුණුකිරීමේ වැඩසටහන්වලට අමතරව, වෙනත් ආයතනවල පුහුණු කිරීම් කටයුතුවලට සහාය වීමද, ප්‍රාදේශීය කාර්යාලය විසින් කරගෙන යන ලදී. කාන්තා කාර්යාංශය, යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කාර්මික සංවර්ධන මණ්ඩලය,

**1985 දෙසැම්බර් අවසානයට ගම් නගා සිටුවීමේ හා**

| වර්ගය | බැංකු වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | | බැංකු විසින් අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | ඒකක | වටිනාකම | ඒකක | වටිනාකම |
| **1. උස්සාන වාරිමාර්ග යටතේ කෘෂිකර්මය** | | | | |
| 1. 1 වතුර පොම්ප සවිකරන ලද භාරනලද ළිං .. | 429 | 3,842·9 | 131 | 1,164·7 |
| 1. 2 කෙසෙල් වගාව .. | 03 | 13·3 | 01 | 3·5 |
| 1. 3 සුළංබල යන්ත්‍රය .. | 41 | 548·5 | 05 | 71·2 |
| 1. 4 රෝද දෙකේ ට්‍රැක්ටර් .. | 31 | 1,022·0 | 18 | 606·0 |
| 1. 5 කෘෂි උපකරණ .. | 42 | 91·0 | 18 | 24·7 |
| **2. සත්ව පාලනය** | | | | |
| 2. 1 කුකුල් පාලනය .. | 77 | 474·2 | 28 | 167·3 |
| 2. 2 කිරිපට්ටි පාලනය .. | 177 | 1,064·3 | 33 | 193·0 |
| 2. 3 එළුවන් පාලනය .. | 151 | 608·9 | 43 | 160·5 |
| 2. 4 ඌරු පාලනය .. | 78 | 248·1 | 23 | 85·5 |
| **3. කර්මාන්ත** | | | | |
| 3. 1 කොන්ක්‍රීට් සහ ගල් වැඩ .. | 03 | 18·6 | — | — |
| 3. 2 ගඩොල් නිෂ්පාදනය .. | 11 | 46·3 | 05 | 22·7 |
| 3. 3 බේකරි හා රස කැවිලි .. | 48 | 319·3 | 31 | 153·2 |
| 3. 4 කම්මල්, ටින්කර් සහ වෑල්ඩින් .. | 22 | 407·3 | 05 | 67·6 |
| 3. 5 වඩුවැඩ හා ලී කැටයම් .. | 17 | 131·0 | 11 | 92·4 |
| 3. 6 බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය .. | 05 | 24·5 | 03 | 13·9 |
| 3. 7 රෙදිපිළි නිෂ්පාදන හා බතික් .. | 24 | 175·2 | 12 | 98·5 |
| 3. 8 කොහු නිෂ්පාදනය .. | 07 | 27·3 | 05 | 19·3 |
| 3. 9 ලිපි ද්‍රව්‍ය හා සබන් නිෂ්පාදනය .. | 03 | 20·3 | 01 | 5·5 |
| 3.10 ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය .. | 02 | 9·0 | 01 | 3·0 |
| 3.11 සම්භාණ්ඩ නිෂ්පාදනය .. | 03 | 29·0 | 03 | 25·0 |
| 3.12 මැටි කර්මාන්තය .. | 11 | 65·5 | 01 | 10·0 |
| 3.13 වී කෙටීම .. | 01 | 10·0 | — | — |
| 3.14 විසිතුරු මාළු ඇති කිරීමේ කර්මාන්තය .. | 03 | 21·5 | 01 | 10·0 |
| **4. සේවා** | | | | |
| 4. 1 ගෘහ ප්‍රයෝජනයට ගන්නා ආහාර සහ ද්‍රව්‍ය ඇසුරුම් හා වෙළෙඳාම .. | 19 | 81·0 | 08 | 28·0 |
| 4. 2 පාපැදි අළුත් වැඩියා කිරීමේ ඒකක .. | 27 | 174·0 | 13 | 68·0 |
| 4. 3 ඡායාරූප ශිල්පය .. | 02 | 15·0 | 1 | 8·5 |
| 4. 4 බාබර් වැඩ .. | 07 | 24·8 | 5 | 17·3 |
| 4. 5 විදුලි භාණ්ඩ අළුත් වැඩියාව .. | 02 | 26·0 | 1 | 16·0 |
| 4. 6 බැටරි යළි පිරවීම .. | 02 | 16·4 | 2 | 16·4 |
| 4. 7 ප්‍රවාහන සේවා .. | 01 | 2·0 | — | — |
| 4. 8 නාම පුවරු ඇඳීම .. | 01 | 5·0 | 1 | 5·0 |
| 4. 9 ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කිරීම .. | 04 | 20·5 | 1 | 5·5 |
| එකතුව .. | 1,254 | 9,578·7 | 411 | 3,162·4 |

**2.18 සංඛ්‍යා සටහන**

**ස්වයං රැකියා යෝජනා ක්‍රම යටතේ ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය**

වටිනාකම රුපියල් '000

| මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘති | | | | ආපසු ගෙවීම් | | | | ගෙවන ලද ඒකක | සේවා නියුක්තිය | ඇස්තමේන්තුගත ආදායම (මාසික) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒකක | බැංකු ණය | ණය කරුගේ දයකත්වය | එකතුව | ආපසු ගෙවිය යුතු ඒකක සංඛ්‍යාව | 1985 දෙසැ. අවසානයට ගෙවීමට තිබූ මුදල | 1985 දෙසැ. අවසානයේදී ගෙවනලද මුළු මුදල | නොගෙවා තිබූ මුළු මුදල | | | |
| 114 | 1,010·4 | 248·7 | 1,259·1 | 77 | 209·6 | 141·2 | 68·4 | 11 | 250 | 448·9 |
| 01 | 3·5 | 0·5 | 4·0 | 01 | 3·5 | 1·5 | 2·0 | — | 01 | 3·2 |
| 05 | 71·3 | 13·2 | 84·4 | 02 | 5·0 | 5·0 | — | — | 08 | 26·3 |
| 16 | 551·0 | 324·4 | 875·4 | 08 | 15·9 | 15·9 | — | — | 32 | 66·6 |
| 18 | 24·7 | 7·7 | 32·4 | — | — | — | — | — | — | — |
| 22 | 125·5 | 41·0 | 166·5 | 16 | 52·0 | 31·8 | 20·2 | 06 | — | — |
| 23 | 136·9 | 29·4 | 166·3 | 14 | 21·9 | 19·2 | 2·7 | — | 23 | 11·5 |
| 37 | 131·1 | 20·9 | 151·9 | 27 | 59·3 | 44·0 | 15·3 | 03 | 37 | 12·9 |
| 18 | 65·8 | 20·5 | 86·3 | 11 | 26·1 | 9·2 | 17·0 | 07 | — | — |
| — | — | — | — | — | — | — | — | — | — | — |
| 03 | 14·5 | 3·5 | 18·0 | 03 | 11·7 | 5·9 | 5·9 | — | — | — |
| 28 | 135·2 | 91·0 | 226·2 | 21 | 53·1 | 39·4 | 13·7 | 07 | 45 | 420·0 |
| 05 | 67·6 | 23·4 | 91·0 | 03 | 15·9 | 15·9 | — | 02 | 09 | 25·4 |
| 10 | 85·1 | 24·5 | 109·7 | 07 | 36·6 | 27·2 | 9·4 | 02 | 15 | 100·0 |
| 03 | 13·9 | 2·7 | 16·6 | 02 | 6·4 | 4·9 | 1·4 | 01 | 12 | 25·6 |
| 11 | 83·5 | 35·3 | 118·9 | 07 | 16·3 | 16·3 | — | 04 | 28 | 88·0 |
| 05 | 19·3 | 3·4 | 22·7 | 05 | 11·9 | 8·0 | 3·9 | — | 03 | 8·0 |
| 01 | 5·5 | 1·2 | 6·8 | 01 | 5·5 | 5·3 | 0·2 | — | — | — |
| 01 | 3·0 | 1·0 | 4·0 | 01 | 2·1 | 1·9 | 0·2 | — | 02 | 2·8 |
| 03 | 25·0 | 18·4 | 43·5 | 03 | 4·7 | 4·7 | — | — | 08 | 36·0 |
| 01 | 10·0 | 2·0 | 12·0 | 01 | 1·7 | 1·7 | — | — | 02 | 2·3 |
| — | — | — | — | — | — | — | — | — | — | — |
| 01 | 10·0 | 3·5 | 13·5 | 01 | 1·9 | 1·8 | — | — | 02 | 2·5 |
| 07 | 25·0 | 16·7 | 41·7 | 06 | 9·3 | 7·4 | 1·9 | 01 | 10 | 52·5 |
| 13 | 68·0 | 31·5 | 99·5 | 13 | 35·0 | 34·1 | 0·8 | — | 16 | 39·0 |
| 01 | 8·5 | 5·0 | 13·5 | 01 | 8·2 | 8·3 | — | — | 01 | 6·4 |
| 5 | 17·4 | 3·8 | 21·2 | 05 | 10·2 | 5·9 | 4·3 | — | 08 | 12·5 |
| 1 | 16·0 | 8·0 | 24·0 | 01 | 4·5 | 3·7 | 0·8 | — | 03 | 12·4 |
| 2 | 16·4 | 5·0 | 21·4 | 01 | 5·7 | 5·7 | — | — | — | 2·1 |
| — | — | — | — | — | — | — | — | — | — | — |
| 1 | 5·0 | 0·6 | 5·6 | 01 | 2·8 | 1·5 | 1·3 | — | 02 | 3·0 |
| 1 | 5·5 | 0·6 | 6·1 | 01 | 1·0 | 1·0 | — | — | 02 | 2·0 |
| 357 | 2,754·6 | 987·5 | 3,742·1 | 240 | 637·9 | 468·4 | 169·5 | 44 | 520 | 1,409·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

බැංකු, ග්‍රාමෝදය ව්‍යාපාරය හා සර්වෝදය, ප්‍රාදේශීය කාර්යාලයේ නිරතුරු සහාය ලැබූහ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලය සම්මන්ත්‍රණ රැස්වීම් විසි පහකටත් වඩා අමතා තිබිණ.

---

### සංවර්ධන කටයුතු ප්‍රදර්ශනය කිරීම

ප්‍රාදේශීය කාර්යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම නිමිත්තෙන් එතෙක් කරන ලද සංවර්ධන කටයුතු සහ ව්‍යාපෘතීන් පෙරදැරි කර ගත් ණය දීම් වැඩපිළිවෙල පිළිබිඹු කෙරෙන විශේෂ තුන් දින ප්‍රදර්ශනයක් 1985 අගෝස්තු මාසයේදී පවත්වනු ලැබීය. මෙම ප්‍රදර්ශනය පවත්වන ලද්දේ කණ්ඩායම් තුනක් සඳහාය. එනම්,

(i) රජයේ නිලධාරීන්,

(ii) ගැමි ජනතාව හා

(iii) පාසැල් සිසුන්.

ප්‍රදර්ශනය නැරඹීම සඳහා 6,500 ට වැඩි ජනතාවක් පැමිණි බව ගණන් බලා ඇත. ප්‍රදර්ශනයෙන් පසු ව්‍යාපෘතීන් සඳහා අයදුම්පත් හා විමසුම් විශාල සංඛ්‍යාවක් ලැබී ඇත.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික්කය තුළ පිහිටි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යාපෘතීන් අධීක්ෂණයෙහි ලා සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවට තවදුරටත් සහාය විය. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමයෙහි දත්ත රැස් කරන්නන් ප්‍රාදේශීය කාර්යාලයේ අධීක්ෂණය යටතේ කටයුතු කළ අතර, එම ක්‍රමය සඳහා පාරිභෝගික හා යෙදවුම් මිළ ගණන් එකතු කිරීමද තවදුරටත් ප්‍රාදේශීය කාර්යාලය මගින් කෙරිණ.

ප්‍රාදේශීය කාර්යාලයේ නිෂ්කාශණාගාරය මගින් රු. 16,00,28,346.19 ක වටිනාකමින් යුත් චෙක්පත් නිෂ්කාශණය කරන ලදී.

### ප්‍රාදේශීය කාර්යාලය—මාතලේ

ශ්‍රී ලංකා මහ බැංකුවේ තෙවැනි ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු 1985 දෙසැම්බර් 23 වැනි දින මාතලේදී ආරම්භ කරන ලදී. මාතලේ, මහනුවර සහ කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්ක මෙම කාර්යාලයේ මෙහෙයවුම් ප්‍රදේශයන් ලෙස ගැනෙයි.

ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවීමේ මූලික අරමුණක් වූයේ, සංවර්ධන ණයකරන සංකල්පය පදනම් කොට, වඩාත් අර්ථාන්විත හා කාර්යශීලී අන්දමට ග්‍රාමීය අංශයේ බැංකු කටයුතු අවශ්‍යතාවයන් සළසනු වස්, ග්‍රාමීය පෙදෙස්හි සිය කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා වාණිජ බැංකු දිරිගැන්වීමය. මෙම කාර්යයෙහිලා ප්‍රාදේශීය කාර්යාලයෙන් බලාපොරොත්තු වනුයේ, සංවර්ධන හැකියාවන් හඳුනා ගැනීම, සංවර්ධන ණය සම්පාදනයෙහි ප්‍රශ්න නිරාකරණය කිරීම සහ බැංකු කටයුතු අංශයට අවශ්‍ය සහායදීම හා මඟ පෙන්වීමය. අනුග්‍රාහක පොළී අනුපාතිකයන් යටතේ ලබාගත හැකි ණය පහසුකම් පිළිබඳව ග්‍රාමීය ජනතාවට දැනුමක් ලබාදීමට හා දැනට ඔවුන් තුල ඇති වැරදි ආකල්ප වෙනස් කිරීමටද, ප්‍රාදේශීය බැංකුව උත්සාහ දැරීය. මේ සම්බන්ධයෙන්, හොඳ අනුග්‍රාහකයින් වීමෙන් ඇතිවන වාසි පිළිබඳව ගොවීනට පැහැදිලි කර දීම අත්‍යවශ්‍ය කරුණකි. ඔවුන් සමග නිරන්තර අදහස් හුවමාරු කර ගැනීම මගින් අසතුටුදායක බැංකු පිළිවෙත් ඉවත් කරලීමට හැකිවනු ඇත. ගැමියා සහ බැංකුකරුවා අතර තිබෙන කෙමෙන් පුළුල්විගෙන යන පරතරය නැතිකොට, ග්‍රාමීය අංශයේ සංවර්ධනය උදෙසා යහපත් බැංකු ව්‍යූහයක් ගොඩනැංවීමට මෙම උත්සාහය අවසානයේදී හේතුවනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

යෝජිත ''ස්වයං රැකියා හා ගම් නඟා සිටුවීමේ යෝජනා ක්‍රමය'' සම්පූර්ණ කරනතෙක්, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවියනට '' නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය'' පිළිබඳව කරුණු වටහා දීමේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමේ මූලික වැඩ කටයුතුවල මාතලේ ප්‍රාදේශීය බැංකුව නිරත විය. තවද, මාතලේ, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, නුවරඑළිය හා පුත්තලම යන දිස්ත්‍රික්කවල ලංකා බැංකු සහ මහජන බැංකු ශාඛා කළමණාකරුවන් හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ ශාඛා කළමණාකරුවන් සඳහා නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කරුණු වටහාදීම උදෙසා සමුළුවක් මහනුවරදී පවත්වන ලදී. මාතලේ ප්‍රාදේශීය '' නිෂ්කාශණාගාරයක් '' පිහිටුවීම සඳහා මූලික විධිවිධාන ද සලසන ලදී.

## අනුග්‍රාහක සේවා

මහ බැංකුවේ, වාණිජ බැංකුවල, සංවර්ධනය පෙරදැරි කරගත් අමාත්‍යාංශ සමහරක හා රාජ්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත බැංකු කටයුතු පිළිබඳ අනුග්‍රාහක සේවා කමිටුව, 1981 වර්ෂය මැද්දී පිහිටුවනු ලැබීය. වාණිජ බැංකු අනුග්‍රාහකයින්ට සළසනු ලබන සේවාවන් දියුණු කිරීමේ අරමුණට මුල් තැන දෙමින් එකී කමිටුව එවක් පටන් කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු හා බැඳුණු අනුග්‍රාහක සේවා සම්බන්ධයෙන් තැපැල් මාර්ගික සමීක්ෂණයක් 1985 වර්ෂය තුළදී එකී කමිටුව මගින් පවත්වන ලදී. සසම්භාව්‍ය නියැදියන් මත වාණිජ බැංකු පහකින් තෝරාගත් අනුග්‍රාහකයින් 10,000 දෙනෙකු වෙත 1985 වර්ෂය ආරම්භයේදී ප්‍රශ්නාවලියක් නිකුත් කරන ලදී. එකී ප්‍රශ්නාවලිය ලැබූ අය අතුරින් සියයට 20 ක් පමණ දෙනා පිළිතුරු සැපයූ අතර, දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව මගින් එම පිළිතුරු සැකසුමට භාජනය කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරනු ලබන එකී සමීක්ෂණයේ වාර්තාව දනට කෙටුම්පත් ස්වරූපයෙන් නිමවා තිබෙන අතර, 1986 වර්ෂයේදී එය මහජනයා වෙත ඉදිරිපත් කිරීමට හැකි වෙතැයි බලාපොරොත්තුවනු ලැබේ.

## ප්‍රකාශන

මුදල් නීති පනතේ 35 වැනි වගන්තිය ප්‍රකාර, 1984 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව, ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙත පිළිගන්වන ලදී. අනතුරුව, 1984 වර්ෂය සඳහා වූ ආර්ථික විවරණයද ප්‍රකාශයට පත් කරන ලදී. මාසික විවරණිකාවද නිතිපතා පළ කෙරිණ. 1985 වර්ෂයේ ප්‍රථම භාගයේ කටයුතු පිළිබඳ කෙටි සමාලෝචනයක් 'ආර්ථික හැඩගැස්ම—1985 ප්‍රථම භාගය ' යනුවෙන් වර්ෂය තුළදී පළ කෙරිණ.

එසේම, වර්ෂය තුළදී පළ කරන ලද ප්‍රකාශනයන් අතර, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය යටතේ එක් රැස් කරන ලද දත්තයන්ගෙන් සමන්විත 1985 මිළ සහ වැටුප් සංඛ්‍යාන හා 1985 වර්ෂය පිළිබඳ මූලික දත්ත ඇතුළත් සමාජ ආර්ථික දත්ත පත්‍රිකාව ද විය. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ දත්ත—1984 ත්, පාරිභෝජන සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තාව—1981/82, I වැනි කොටසේ සිංහල පිටපත හා එම වාර්තාවේම දත්ත පිළිබඳ සංඛ්‍යා සටහන් වලින් සමන්විත II වැනි කොටසේ ඉංග්‍රීසි පිටපතද පළ කරන ලදී. මාණ්ඩලික පත්‍රිකාවේ 12 වැනි වෙළුමේ අංක 2, සහ 13 වැනි වෙළුමේ අංක 1 හා 2 ද, ආචාර්ය විමල් වික්‍රමසිංහගේ ' බහුවිධ විනිමය අනුපාතික පිළිබඳ න්‍යාය හා ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික පාලනය ' ද ඒ අන්දමින්ම පළ කරන ලදී.

කාලීන ලිපි අතරට, එන්. ජී. පී. පණ්ඩිතරත්න මහතා විසින් සම්පාදිත 'මහවැලි ජනපදිකයින් සහ ග්‍රාමීය ණය පිළිබඳ ගැටළු' යන අංක 9 කාලීන ලිපියද, ආචාර්ය වර්ණසේන රාසපුත්‍ර විසින් සම්පාදිත ' රජයේ භාණ්ඩාගාර, ක්‍රම සම්පාදන හා සංවර්ධන නියෝජිත ආයතන සමඟ පවත්නා මහ බැංකු සබඳතා ' යන අංක 10 කාලීන ලිපිය ද, එම්. නරසිංහම් මහතා (ඉන්දියානු රිසර්ව් බැංකුවේ හිටපු අධිපති) විසින් සම්පාදිත 'බැංකු හා කෘෂි ණය, ඉන්දියානු අත්දැකීම් යන අංක 11 කාලීන ලිපිය ද, සුමති නිමල් ප්‍රනාන්දු මහතා විසින් සම්පාදිත

'කලාපීය ආනයන ආයතන—දකුණු ආසියාවේ කර්මාන්ත සම්බන්ධයෙන් කලාපීය සහයෝගිතාවය උදෙසා වැඩ පිළිවෙලක්' යන අංක 12 කාලීන ලිපියද, එන්. යූ. ජයවර්ධන මහතා විසින් සම්පාදිත 'කුළී පිට ගැනුම් හා බදු මූල්‍යකරණය' යන අංක 13 කාලීන ලිපිය ද එක් කරන ලදී. ණය තොරතුරු විවරණිකාවේ අංක 5 ''ධීවර කර්මාන්තය සඳහා ණය'' යන මැයෙන් පළ කරන ලදී.

## සම්මන්ත්‍රණ

'බැංකු නොවන මූල්‍ය ආයතන සහ මූල්‍ය ප්‍රතිපත්ති' නම් වූ තුන්දින සම්මන්ත්‍රණයක් 1985 ජූනි 3 සිට 5 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුග්‍රහයෙන් පවත්වන ලදී. අග්නිදිග ආසියානු මහ බැංකු (සියසන්) මගින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණයට ඉන්දුනීසියානු මහ බැංකුවේ, මැලේසියානු නෙගාරා මහ බැංකුවේ, නේපාල මහ බැංකුවේ, පිලිපීන මහ බැංකුවේ, තායිලන්ත මහ බැංකුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ, නිලධාරීහු සහභාගි වූහ.

## සමීක්ෂණ

### දිප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය

දිප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය යටතේ පාරිභෝගික භාණ්ඩ 220 ක පමණ සිල්ලර මිළ, ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි නිෂ්පාදකයාගේ මිළ, කෘෂිකාර්මික යෙදවුම්හි සිල්ලර මිළ සහ වී වගාවේ, තේ, රබර් හා පොල් වගා කළ කුඩා වතුවල හා ගොඩනැගිලි කර්මාන්තයේ වැටුප් අනුපාතික එක්රැස් කරනු ලැබේ. පාරිභෝගික භාණ්ඩ, කෘෂිකාර්මික යෙදවුම් හා ශ්‍රමය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ තොරතුරුද රැස් කරනු ලැබේ. දිවයිනේ තෝරාගත් මධ්‍යස්ථාන 100 කින් නිත්‍ය පදනමක් යටතේ මෙම දත්ත රැස්කොට ''මිළ හා වැටුප් සංඛ්‍යාන; සිල්ලර, නිෂ්පාදන හා යෙදවුම් මිළ හා වැටුප්'' යටතේ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලැබේ.

### ආනයන පහසු කිරීමේ වැඩ පිළිබඳ විමසුම

ණයවර ලිපි හා ණයවර ලිපිවලට අදාල බිල්පත්වල දත්ත මාසිකව ලබා ගැනීමෙන්, විවෘත ආනයන ක්‍රියා පිළිවෙත් විමසුමට ලක් කිරීම බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් කරගෙන යනු ලැබීය. මෙකී දත්තයන් හා ඒවායේ විශ්ලේෂණයන් අවශ්‍ය බලධාරීන්ට නිත්‍ය පදනමක් යටතේ සපයන ලදී.

### සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ සමීක්ෂණය

ආයෝජන ව්‍යූහය, යොමු කෙරෙන දිසාව, සැළසුම්, සම්පත් හා ඒවා භාවිතය සහ ආයෝජන පරිමාණය, අගැයීම සඳහා ව්‍යාපාරික කටයුතු හා සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ සමීක්ෂණයක් වාර්ෂික පදනමක් යටතේ පවත්වනු ලැබේ. 1983/1984 සිට 1985/1986 දක්වා කාලච්ඡේදයට අදල ව්‍යාපාරික කටයුතු හා සැළසුම්ගත ආයෝජන පිළිබඳ සමීක්ෂණ වාර්තාව නිමකොට ඇත.

### ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවල අනුග්‍රාහක සේවා පිළිබඳ සමීක්ෂණය

බැංකු කටයුතු පිළිබඳ අනුග්‍රාහක සේවා කමිටුවේ ඉල්ලීම පරිදි වාණිජ බැංකුවල අනුග්‍රාහක සේවා පිළිබඳ සමීක්ෂණය 1985 ජනවාරි - අප්‍රේල් කාලය තුළදී පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රධාන පරමාර්ථය වූයේ, සිය බැංකුකරුවන් විසින් සළසනු ලබන සේවාවන් කෙරෙහි බැංකු අනුග්‍රාහකයන් දක්වන ආකල්පයන් පිළිබඳ තොරතුරු රැස් කොට, එමගින් ශ්‍රී ලංකාවේ බැංකු සේවාවන්හි විෂයපථය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ක්‍රම හා විධි සලකා බැලීමය.

## පුහුණු කිරීම

1985 වර්ෂය තුළදී බැංකු නිලධාරීන් සඳහා සිය අධ්‍යාපනික හා ප්‍රායෝගික පුහුණු කිරීමේ වැඩ පිළිවෙල පවත්වාගෙන යාම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යනු ලැබීය. අධ්‍යයන පාඨමාලා ප්‍රධාන වශයෙන් ආර්ථික විද්‍යාව හා ආර්ථිකමිතිය පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා යොමු විය. පිටරටදී මෙන්ම මෙරටදීද පවත්වනු ලැබූ කෙටිකාලීන පාඨමාලා, සම්මන්ත්‍රණ,

වැඩමුළු, අධ්‍යයන චාරිකා යනාදී වශයෙන් වූ ප්‍රායෝගික පුහුණු කිරීම්වලට ග්‍රාමීය සංවර්ධනය, කෘෂිකාර්මික හා කාර්මික ණය, බැංකු කටයුතු හා පරිගණක විද්‍යා අධ්‍යයනය ආදී ක්ෂේත්‍රයන් ඇතුළත් විය.

1985 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ දොළොස් මස් කාලය තුළදී පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා නිලධාරීන් නව දෙනෙක් පිටරට ගියහ. මින් හය දෙනෙක් ශාස්ත්‍රපති පාඨමාලා හැදෑරීම සඳහා වූ අතර, තිදෙනෙක් ආචාර්ය උපාධිය සඳහා වූහ. එක් නිලධාරියෙක් පේරාදෙණිය සරසවියේ පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධිය සඳහා උගත් අතර, සිව්දෙනෙක් කොළඹ සරසවිය, වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා ජාතික ව්‍යාපාර කළමණාකාර ආයතනය යන ආයතනවල ඩිප්ලෝමා පාඨමාලා හැදෑරූහ. ප්‍රායෝගික පුහුණුවීම සඳහා නිලධාරීන් 94 දෙනෙක් එතෙර ගියහ. ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් සංවිධානය කරන ලද පාඨමාලාවලට නිලධාරීන් 151 දෙනෙක් සහභාගි වූ අතර, තවත් නිලධාරීන් 116 දෙනෙක් මෙරට වෙනත් පුහුණු කිරීමේ ආයතන විසින් සංවිධානය කරන ලද කෙටි කාලීන පුහුණු පාඨමාලා සහ සම්මන්ත්‍රණවලට සහභාගී වූහ.

මහ බැංකු නිලධාරීන් සඳහා ලංකා බැංකුවේ වූ වාණිජ බැංකු පරිචය හා මෙහෙයවුම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ පුහුණු පාඨමාලාව 1985 මැයි මාසය දක්වා ක්‍රියාත්මක විය. නිලධාරීන් තිදෙනෙක් මීට සහභාගි වූහ. 1986 වර්ෂයේදී ද මෙම පාඨමාලාව දිගටම පවත්වාගෙන යාමට අදහස් කෙරේ.

## දත්ත සැකසුම

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව, 1985 වර්ෂයේදී පහත දැක්වෙන පරිගණක ඉල්ලුම්පත් පිළිබඳ කටයුතු කරන ලදී.

1. සේවක අර්ථ සාධක අරමුදලේ ගිණුම් ක්‍රමය
2. ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය
3. ආනයන පිරික්සුම් ක්‍රමය
4. රාජ්‍ය ගිණුම් ශාඛාව සහ ජංගම ගිණුම්
5. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ගිණුම් ක්‍රමය
6. සංඛ්‍යාන සමීක්ෂණ
   i. බැංකු කටයුතුවල අනුග්‍රාහක සේවා පිළිබඳ සමීක්ෂණය;
   ii. ලෝක බැංකුව සඳහා 1978/1979 සහ 1981/1982 පාරිභෝජන සමීක්ෂණ දත්ත විශ්ලේෂණය – 1970 සිට ශ්‍රී ලංකාවේ ජීවන තත්ත්වයේ විකාශනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු අධ්‍යයනය.
7. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සඳහා ආර්ථික ආකෘතීන් පිළිබඳ තක්සේරුව
8. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා ජාතික හැඳුනුම්පත් අංක යෙදීමේ ක්‍රමය

9. වැටුප් ගිණුම් ක්‍රමය සහ වෙනත් ගෙවුම්

10. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය

11. ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ගේ විශ්‍රාම සුභසාධක ක්‍රමය

12. ශ්‍රී ලංකා මහ බැංකු සුභසාධක ණය ක්‍රමය

13. ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා කළමණාකරණ ප්‍රවෘත්ති ක්‍රමය

14. ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුම් ක්‍රමය

15. මූල්‍ය වෙළෙඳපොල සහ විදේශ විනිමය ගණුදෙනු

16. ලංකා දුම්රිය සේවය පිළිබඳ සංඛ්‍යාන

මීට අමතරව, සේවක අර්ථ සාධක අරමුදලේ පාස් පොත් නිකුත් කිරීම පරිගණක ගත කිරීමේ කාර්යය බාර ගන්නා ලදී. පාස් පොත් ක්‍රමයට අදාළ වැඩ සටහන් අත්හදා බලනු ලැබ වැඩ පටන් ගැනීමට පිළියෙල කොට ඇත. යන්ත්‍රකෘත චෙක්පත් නිශ්කාෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමටද මෙම දෙපාර්තමේන්තුව විසින් බාර ගනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ මූලික කටයුතු 1985 වර්ෂයේදී නිම කරන ලද අතර, 1986 වර්ෂය අවසාන වනවිට කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. මෙම කාලය තුළදී අපනයන පිරික්සුම් ක්‍රමයේ දත්ත සැකසුම් කටයුතු ද බාර ගන්නා ලදී. බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ පොදු ලෙජරය සහ ශේෂ පත්‍රය 1985 වර්ෂයේදී පරිගණක යන්ත්‍රගත කෙරුණ අතර 1986 මුලදී එහි නිමවුම් කටයුතු ඇරඹෙනු ඇත.

## කළමණාකාරිත්ව විගණන

අභ්‍යන්තර විගණන අංශය, 1985 වර්ෂය තුළදී මාතර හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල ඇතුළු බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවල විගණන කටයුතුවල නිරත විය. ඒකාබද්ධ ආයෝජන අරමුදලේ සියලුම මෙහෙයවුම් ආවරණය වන පරිදි රාජ්‍ය ණය විගණන කටයුතු පුළුල් කරන ලදී.

කළමණාකාරිත්ව සේවා අංශය මගින් කාර්ය මණ්ඩල අවශ්‍යතාවන්, වැඩ න්‍යායන්, පවත්නා ක්‍රියා පිළිවෙත් සහ සංවිධාන හා ක්‍රම පැවරුම් පිළිබඳ කටයුතු කරගෙන යාමේදී අභ්‍යන්තර පාලනයන් අධ්‍යයනය සමාලෝචනයෙහි යෙදිණ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් පිළිබඳ අධ්‍යයනය 1985 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල වැටුප් රහිත නිවාඩු ගැනීම පිළිබඳ වාර්තාවක් ද පිළියෙල කෙරිණ. වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අපනයන 'පසු විපරම් ශාඛාවේ' මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වැඩ න්‍යායන් පිළිබඳ වාර්තාවක් ද අවසන් කරන ලද අතර, ඒ පිළිබඳ වාර්තාවක් ද ඉදිරිපත් කරන ලදී.

# කාර්ය මණ්ඩල පුවත්

1985 වර්ෂය තුළදී අධිපති ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍ර පහත සඳහන් සමුළු හා රැස්වීම්වලට සහභාගි විය.

(අ) මලයාසියාවේ කොටා කිනාබාලු හි පවත්වන ලද අග්නිදිග ආසියානු මහ බැංකු (සියසන්) අධිපති වරුන්ගේ 20 වැනි සම්මන්ත්‍රණය.

(ආ) නේපාලයේ කත්මන්ඩු හි පවත්වන ලද අග්නිදිග ආසියාව, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාවේ (සියන්සා) අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය.

(ඇ) නේපාලයේ කත්මන්ඩු හි පවත්වන ලද ආසියානු නිෂ්කාශණ සංගමයේ 13 වැනි මණ්ඩලීය සභාවාරයේ රැස්වීම.

(ඈ) ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් හි පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අන්තර් කමිටු රැස්වීම.

(ඉ) ඉතාලියේ රෝම නුවර පවත්වන ලද උතුරු-දකුණු වට මේස සාකච්ඡාව සහ ජාත්‍යන්තර සංවර්ධන සමිතියේ 18 වැනි ලෝක සම්මන්ත්‍රණය.

(ඊ) දකුණු කොරියාවේ, සෝල් නගරයේ පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවේ වාර්ෂික රැස්වීම.

(උ) නිල සාකච්ඡා සඳහා පකිස්තානු රාජ්‍ය බැංකුවට සහ චීන මහජන බැංකුවට.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නොපැමිණි අවස්ථාවල මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයාගේ විකල්ප නිලධාරියා ලෙස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ජී. කුමාරනතුංග මහතා කටයුතු කළේය.

අධිපති දිවයිනෙන් බැහැරව සිටි අවස්ථාවල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා ප්‍රධාන විධායක නිලධාරියා සහ මුදල් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේය.

**පත්වීම්**

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වී. එන්. ඩී. නානායක්කාර මහතා 1985 ජනවාරි 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ණය අධිකාරී වශයෙන් පත් කරන ලදී.

රාජ්‍ය ණය අධිකාරී පී. අමරසිංහ මහතා 1985 ජනවාරි 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ජී. එම්. අබයරත්න 1985 නොවැම්බර් 15 වැනි දින සිට සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හා අතිරේක ප්‍රධාන ගණකාධිකාරී පී. එම්. නාගහවත්ත මහතා 1985 නොවැම්බර් 15 වැනි දින සිට විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

විනිමය පාලක ඩී. ඒ. පී. වීරවර්ධන මහතා 1985 නොවැම්බර් 15 වැනි දින සිට විනිමය පාලනය පිළිබඳ උපදේශක වශයෙන් පත් කරන ලදී.

සංඛ්‍යාන අධ්‍යක්ෂ ආචාර්ය එන්. ටී. එච්. සඳරත්න 1985 නොවැම්බර් 15 වැනි දින සිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

එස්. පට්ටිවිදාන මහතා මුදල් අධිකාරී වශයෙන් වැඩ බැලීම සඳහා 1985 ජනවාරි 15 වැනි දින සිට පත් කරන ලදී. 1985 ජූනි 8 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු වැඩ බලන මුදල් අධිකාරී වශයෙන්ද, 1985 නොවැම්බර් 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන්ද, ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්ද පත් කරන ලදී.

නියෝජ්‍ය මුදල් අධිකාරී ජී. ඩී. බී. මුනිදාස මහතා 1985 නොවැම්බර් 15 වැනි දින සිට මුදල් අධිකාරී වශයෙන් වැඩ බැලීම සඳහා පත් කරන ලදී.

**මුදා හරිනු ලැබ සිටි නිලධාරීහු (1985 දෙසැම්බර් 31 වැනි දිනට)**

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු පහත දක්වෙන අමාත්‍යාංශවලට, රජයේ දෙපාර්තමේන්තුවලට හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවලට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තනතුරු සඳහාද මුදා හරිනු ලැබ සිටියහ.

විධායක අධ්‍යක්ෂ ඒ. එස්. ජයවර්ධන මහතා බංගලා දේශය, භූතානය, ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එස්. ඊස්පරදාසන් මහතා විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ විදේශ ණය පාලන හා පරිපාලන ඒකකයේ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්. ටී. එන්. ප්‍රනාන්දු ලංකා බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඒ. සී. රත්දෙනි, ආචාර්ය ජී. අබේසේකර, ආචාර්ය අයි. කුමාරස්වාමි, ආචාර්ය එස්. එස්. කොළඹගේ සහ එම්. බී. දිසානායක, ටී. ඒ. පී. එන්. ඩයස් සහ ජී. ඒ. වී. පොන්සේකා යන මහතුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඩී. එස්. විජේසිංහ පර්යේෂණ අර්ථ ශාස්ත්‍රඥ වශයෙන් සේවය කිරීම සඳහා මැලේසියාවේ සියසන් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වෙත.

**විශ්‍රාම ගැනීම්**

නියෝජ්‍ය අධිපති ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක 1985 මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

උපදේශක ඉංජිනේරු එම්. ඊ. ද අබෲ මහතා 1985 මැයි 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය. එදිනම සිට ක්‍රියාත්මක වන පරිදි ගිවිසුමක් මත ඔහු නැවත සේවාවේ පිහිටුවන ලදී.

මුදල් අධිකාරී ආර්. එම්. තෙන්නකෝන් මහතා 1985 ජූනි 8 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

මාණ්ඩලික IV වැනි ශ්‍රේණියේ නිලධාරී ඒ. ටී. ඩබ්ලිව්. ජෙහෝරත්නම් මහතා 1985 නොවැම්බර් 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

අභාවය

නියෝජ්‍ය අධිපති ටී. ජී. පුංචි අප්පුහාමි මහතා 1985 ඔක්තෝබර් 19 වැනි දින අභාවප්‍රාප්ත විය.